# 2022

## ප්‍රගති වාර්තාව
## முன்னேற்ற அறிக்கை
## Progress Report

# 2023

## ක්‍රියාකාරී සැලැස්ම
## செயற்பாட்டத் திட்டம்
## Action Plan

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு**

Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

www.mpclg.gov.lk www.pubad.gov.lk www.moha.gov.lk

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

**பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும்**
**உள்ளூராட்சி அமைச்சு**

**Ministry of Public Administration, Home Affairs,**
**Provincial Councils and Local Government**

| | රාජ්‍ය පරිපාලන අංශය | ස්වදේශ කටයුතු අංශය | පළාත් සභා හා පළාත් පාලන අංශය |
|---|---|---|---|
| | **නිදහස් චතුරස්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව**<br>**சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.**<br>**Independence Square, Colombo 07, Sri Lanka.** | **"නිල මැදුර", ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.**<br>**"நில மெதுர", எல்விடிகல மாவத்தை, நாரஹன்பிட, கொழும் 05, இலங்கை**<br>**"Nila Madura", Elvitigala Mawatha, Narahenpita, Colombo 05, Sri Lanka** | **අංක 330, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත (යූනියන් පෙදෙස), කොළඹ - 02, ශ්‍රී ලංකාව.**<br>**இல. 330, டாக்டர். கொல்வின் ஆர்.டி. சில்வா மாவத்தை (யூனியன் பிளேஸ்), கொழும்பு - 02, இலங்கை.**<br>**No. 330, Dr. Colvin R. de Silva Mawatha (Union Place), Colombo - 02, Sri Lanka.** |
| | 011- 2 696 211 /13, 011 - 2 166 000 | 011 - 2 050 450 | 011 – 2 305326 / 327, 2303280 |
| | 011 – 2 695 279 | 011 - 2 551 071 | 011 - 2 699 720 |
| | information@pubad.gov.lk | info@moha.gov.lk | info@pclg.gov.lk |
| | www.pubad.gov.lk | www.moha.gov.lk | www.mpclg.gov.lk |

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍යවරයාගේ පණිවිඩය**



අනපේක්ෂිත අභියෝග හමුවේ සැපයුම්දාම ක්‍රියාවලිය බිඳවැටුණු 2022 වර්ෂය දෛනික ජන ජීවිතය පවා අඩාල වී ආර්ථික හා සමාජීය ගැටළු රැසකට අපි මුහුණ දුන් වසරකි. පාලනතන්ත්‍රයේ වෙනසක් දක්වා උඩු දිවූ මෙම ගැටළුව සාමාන්‍යකරණය කරගැනීමට හැකි වූයේ ජන ජීවිතය යහපත් කිරීමේ අභිලාෂය පෙරදැරිව වත්මන් රජය ගනු ලැබූ තීන්දු තීරණ හේතුවෙනි.

එහිදී ග්‍රාමීය පුනර්ජීවන හා ආහාර සුරක්ෂිතාවය සඳහා වන ඒකාබද්ධ බහු ආංශික වැඩසටහන සාර්ථක ව ක්‍රියාත්මක කරමින් අප අමාත්‍යාංශය ද අභියෝගාත්මක වගකීමක් ඉටු කරමින් සිටියි.

රටේ කුමන තත්ත්වයක් පැවතිය ද ක්‍රියාශීලී නීරෝගී දිවිපැවැත්මකට අවශ්‍ය ප්‍රමාණවත් ආහාර, සාධාරණ මිළකට ලබා ගැනීමේ හැකියාව ඇති කිරීමේ දැක්ම පෙරදැරිව ක්‍රියාත්මක වන මෙම වැඩසටහනට නව රජයේ සාර්ව ආර්ථික පුනර්ජීවන ඉලක්කයන් අතර ඉහළ ප්‍රමුඛතාවක් හිමි වේ. මේ වන විට සෑම ග්‍රාම නිලධාරී වසමකම ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන හා ආහාර සුරක්ෂිතතා කමිටු පිහිටුවා අවසන්ය. ආහාර නිෂ්පාදනයෙන් නොනැවති ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනය, අපනයන ප්‍රවර්ධනය, දරුවන්ගේ හා ගැබිණි මවුවරුන්ගේ පෝෂණය, වැනි අංශ පිළිබඳ ව ද මෙම වැඩසටහන මඟින් අධ්‍යයනය කෙරෙන අතර එමඟින් ජනතාවගේ පෝෂණ තත්ත්වය පිළිබඳ විශේෂ අවධානයක් යොමු වනු ඇත.

අප අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනය මෙන්ම ග්‍රාමීය මට්ටම දක්වා දිවයන නිලධාරී ජාලය මෙහෙයවමින් ප්‍රසස්ත මෙහෙවරක් ඉටු කරයි. 2022 වසර තුල කොළඹ මහ නගර සභාව ඇතුළු පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් අමාත්‍යාංශයේ හා පළාත් පාලන අංශය ද ජාතික සංවර්ධනයේ කොටස්කරුවකු විය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සේවයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ද අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු අංශය විවිද වැඩසටහන් ක්‍රියාත්මක කළේය.

පමා වූ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීමට කැබිනට් අනුමැතිය ලබා ගැනීමට හැකිවීමද විශ්‍රාමික ජනතාව වෙනුවෙන් අප අමාත්‍යාංශය සිදුකළ කාලීන අවශ්‍යතාවය ඉක්මවා ගිය යුතුකමකි. එතෙක් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන ගිය නිලමැදුර රජයේ ගොඩනැගිල්ලකට ගෙනඒම මගින් වාර්ශිකව රුපියල් මිලියන 15ක මුදලක් ශේෂ වීමද සාධනිය කාර්යක් බව මාගේ හැඟිමයි.

නිදහසෙන් පසු උදාවූ අභියෝගාත්මක ම වසර වන 2022 වසරේ එම ආර්ථිකමය දුශ්කර බව මෙන්ම දේශපාලනික චංචල බව ද උපරිම ලෙස කළමණාකරණය කර ගැනීමට කැපවීමෙන් කටයුතු කළ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන් හා කාර්ය මණ්ඩලය ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. එළැඹෙන 2023 වසර මෙරට ජනතාවගේ ජීවන තත්වය වඩ වඩාත් යහපත් කරමින් ශ්‍රී ලාංකිකයින් ලෙස අභිමානයෙන් නැඟී සිටීමට අප සියලු දෙනා එකාවන්ව එක්වෙමු.

**දිනේෂ් ගුණවර්ධන,**
**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය,**
**රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය**

## ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



ආරක්ෂක අමාත්‍යාංශය යටතේ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය ලෙස 2020.11.20 සිට 2021.02.16 දින දක්වා පැවති මෙම අමාත්‍යාංශය 2021.02.16 දින සිට ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය ලෙස තනි ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක විය. 2022 මැයි 27 දින සිට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වශයෙන් වෙනස් වූ මෙම අමාත්‍යාංශය ඒ යටතේ වර්තමානයේ දී ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වශයෙන් සිය කාර්යභාරය ඉටුකරනු ලබයි.

රජයේ නව ව්‍යවස්ථා සංශෝධනය අනුව දිස්ත්‍රික් හා ප්‍රාදේශිය පාලනය වඩාත් කාර්යක්ෂම හා ඵලදායිව ක්‍රියාත්මක කිරිමේ ප්‍රායෝගික සැලසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රධානතම වගකීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ අනුව මෙම අමාත්‍යාංශය ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් ධාරීතාවය ශක්තිමත් කිරීම, තාක්ෂණික මෙවලම් ලබාදීම වැනි කාර්යයන් මනාව කළමනාකරණය කරමින් කාර්යක්ෂමව සහ ඵලදායීව මහජන සේවාවන් ලබාදීම සිදුකරනු ලබයි.

කෙසේ වුවද, මේ ඔබට ඉදිරිපත් කරනු ලබන්නේ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2022 ජනවාරි මස සිට 2022 සැප්තැම්බර් මස දක්වා ලඟාකරගන්නා ලද ප්‍රගතිය පිළිබඳ සාරාංශමය වාර්තාවයි.

වත්මන් ලෝකයෙහි පැතිර පවතින කොවිඩ් වසංගත තත්ත්වය හා ජාත්‍යන්තර වශයෙන් පවතින ආර්ථික අර්බුදයට මුහුණ දෙමින්, රටක් ලෙස එයට අනුගත වෙමින් එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශය විසින් සාක්ෂාත් කරගත් සංවර්ධන ප්‍රගතීන් සහ එම ප්‍රගතීන් සාක්ෂාත් කර ගැනීමට ගත් උත්සාහය මෙම වාර්තාව තුළින් පෙන්වා දෙනු ලබයි.

අප රජය බලයට පැමිණීමට පෙර සිටම ජනතාවගේ ඉල්ලීම මෙන්ම අභිලාශය වූයේ ද මනා විනිවිදභාවයකින් යුතු රාජ්‍ය පාලනයකි. ඒ සඳහා රාජ්‍ය සේවකයාගේ වගකීම ඉතා වැදගත් වේ. ඒ අනුව, වගකීමෙන් හා වගවීමෙන් යුතුව සක්‍රීය පාලනයකින් යුත් රටක් නිර්මාණය කිරීමට මෙම අමාත්‍යාංශය මඟින් නියාමනය කරන ලද රාජ්‍ය සේවක යාන්ත්‍රණය තුළ ළඟාකරගත් ප්‍රගතිය ඉතාමත් වැදගත් තැනක් උසුලයි.

ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ ඒකාබද්ධ කාර්යභාරය ඉටුකිරීමට අදාල සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. එසේම මේ පිළිබඳව විශ්ලේෂණාත්මකව බැලීමේදී අදාල කාලය තුල ලබාගෙන ඇති ප්‍රගතිය ජනතා ජයග්‍රහණයක් ලෙස පෙන්වාදෙන්නේ සතුටිනි. පසුගිය වසර තුලදී මෙන්ම ඉදිරි වර්ෂවලදී ද විශිෂ්ට ප්‍රගතියක් ලබා ගනිමින් අනාගතය තුළ ශ්‍රී ලාංකික ජනතාවට තම ජීවිකාව සරිකර ගැනිමේදි මුහුණ දී තිබෙන අභියෝගයන් ජයගනිමින් සෞභාග්‍යමත් දේශයක් ගොඩනංවා ගැනිමට සැමගේ අවධානය යොමු කළයුතු බව ද මේ අවස්ථාවේ සිහිපත් කරන්නට කැමැත්තෙමි.

**අශෝක ප්‍රියන්ත (පා.ම.)**
**ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය**

## පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවුඩය



මහජනතාවට සිය ජීවිත කාලය තුළ පවත්නා අත්‍යවශ්‍ය සේවා සැපයීම මෙන්ම ජීවන තත්වය ඉහළ නැංවීමේ අරමුණින් සියළු පළාත් පාලන ආයතන වෙත සුවිශේෂී කාර්යභාර්යයක් පැවරෙන බව අප පිළිගත යුත්තකි.

එසේ මහජනතාවට සේවය සලසන අතරම පළාත් පාලන ආයතනවලටද ආදායමක් හා වත්කමක් යන තේමාව ක්‍රියාත්මක විය යුතුය යන්න මගේ අදහසයි.

කොට්ඨාස ක්‍රමය යටතේ පළාත් පාලන ආයතනවලට තේරී පත්වී සිටින පළාත් පාලන නියෝජිත මහත්ම මහත්මීන් ජනතාවගේ ගැටලු හඳුනා ගැනීම සඳහා මඟ පෙන්වීම පිළිබඳව අපගේ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මඟින් අවශ්‍ය කටයුතු සිදුකරමින් තිබීම සතුටට කරුණකි.

සියලු පළාත් පාලන ආයතන සඳහා ඉදිරි වර්ෂයේදී කෙටි කාලීන හා මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මක් සකස් කිරීමටත් අනෙකුත් අමාත්‍යාංශ මඟින් සිදුකරන කාර්යයන්ද පළාත් පාලන ආයතන මඟින් සිදුකිරීම සඳහා පළාත් පාලන ආයතන බලගන්වා ප්‍රදේශ තුළ පවතින අවශ්‍යතා බෝහෝදුරට සිදුකරගත හැකි වන පරිදි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

අප අමාත්‍යාශය යටතේ විදේශ අරමුදල් ව්‍යාපෘති ගණනාවක් පාලනය වන බැවින් එයින් 100% ක ප්‍රතිලාභයක් ජනතාවට ලබාදීම මාගේ අභිප්‍රායයි.

දැනට සකස් කර ඇති සැළසුම් තවදුරටත් සොයා බලමින් පුළුල් සමාලෝචනයක් මඟින් ජනතාවගේ අත්‍යවශ්‍ය සේවා සැපයීම හා ජීවන තත්වය ඉහළ නැංවීමට අවශ්‍ය වැඩපිළිවෙළක් ඉදිරි වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම අපගේ වගකීමයි.

පළාත් පාලන ආයතන මඟින් සිදුකෙරෙන කසළ ඉවත් කිරීමේ කටයුත්ත ක්‍රමවත් කරමින් කසළ වලින් තොර පරිසරයක් හා කසළ කළමණාකරණය සිදුකිරීම තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන සියල්ල තදබල ලෙස යොමු කිරීම මාගේ අභිප්‍රායයි.

පළාත් පාලන ආයතන තුළ සිදුකෙරෙන ලිඛිත කටයුතු සියල්ල ඩිජිටල්කරණය තුළින් වඩාත් කාර්යක්ෂම සේවයක් සැපයීමට හැකිවන හෙයින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය ඒකාබද්ධව අප අමාත්‍යාංශයේ පූර්ණ මැදිහත්වීම යටතේ පළාත් පාලන ආයතන 100 ක් පළමු අදියර සඳහා ඩිජිටල් කරණය කිරීමට කටයුතු කරනු ඇත.

පළාත් පාලන ආයතනවල ප්‍රබල අඩුපාඩුවක්ව පවතින ගිනි නිවීමේ ඒකක පිහිටුවීම අදියරෙන් අදියර ඉටුකිරීම සඳහා ඉදිරියේදී එම ඒකකයන් ඒකාබද්ධ කර ගිනි නිවීමේ සේවා දෙපාර්තමේන්තුවක් අප අමාත්‍යාංශය යටතේ පිහිටුවීමට යෝජිත බැවින් ඒ සඳහා ද මාගේ දැඩි අවධානය යොමු වී තිබේ.

පළාත් පාලන පනතේ පවතින විධිවිධානවලට යටත්ව පෙරපාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන වර්තමානයට ගැලපෙන පරිදි සංවර්ධනය කිරීම පළාත් පාලන ආයතන මඟින් සිදුකිරීමටත්, පළාත් පාලන ආයතන සහ ආගමික ස්ථාන අතර සහජීවනය වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය කටයුතු සිදුකිරීමද දැඩි අවශ්‍යතාවයකි.

ජනතාවගේ ජීවනෝපාය මෙන්ම පළාත් පාලන ආයතනවල ආදායම වැඩිකිරීමට නිෂ්පාදන ගම්මාන වැඩසටහන, ක්‍රියාත්මක කිරීමටත්, පුද්ගලික,මහජන, රාජ්‍ය සම්බන්ධතාවය ගොඩනංවා අප අමාත්‍යාංශයේ සියළුම කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය මා වෙත ලබා දෙනු ලබන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**ජානක වක්කුඹුර**

**පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය**

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ පණිවිඩය**



2021 වසර තුළ COVID 19 වසංගතය මධ්‍යයේ මුහුණ දුන් අභියෝග මෙන්ම 2022 වසරේදී මුල් භාගයේදී මුහුණ දීමට සිදුවූ ආර්ථික, සමාජීය හා දේශපාලන අභියෝග මධ්‍යයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත පැවරෙන කාර්යයභාර්යය වෙනස් මගක ගෙනයා යුතු වූ අතර එය තරමක අභියෝගකාරී කටයුත්තක් විය.

ඒ අතුරින් ඉන්ධන හිගය මධ්‍යයේ රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම, දැඩි උද්ධමනකාරී වාතාවරණය හමුවේ රාජ්‍ය සේවකයා පීඩාවට පත්නොවන අයුරින් සේවයට කැඳවීම, ඉදිරියේ තවදුරටත් ඇති විය හැකි ආර්ථික කඩාවැටීම හමුවේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම වැනි මෑත කාලීන ඉතිහාසයේ ඇති නොවූ විවිධාකාර ගැටළු සහ දුෂ්කරතා මධ්‍යයේ රාජ්‍ය සේවය අඛණ්ඩව මෙතෙක් පවත්වාගෙන යාම එක්තරා ආකාරයකට අප ලැබූ ජයග්‍රහණයකි.

මේ සඳහා දීප ව්‍යාප්ත සේවාවන් පහක් හා ඒකාබද්ධ සේවාවන් හතක් ඔස්සේ රාජ්‍ය සේවයේ මානව සම්පත කළමනාකරණය කිරීම සහ සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සියළුම පළාත් පාලන ආයතනවලින් සමන්විත ශ්‍රී ලංකාවේ රාජ්‍ය යාන්ත්‍රනයේ සමස්ථ මෙහෙයුම් පද්ධතිය කළමනාකරණය මෙන්ම රාජ්‍ය වියදම් ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමට දැරූ උත්සාහයන්ගේ සාර්ථකත්වය සඳහා උපරිම දායකත්වය ලබාදුන් විෂයයභාර අමාත්‍යධූරය දරණ ගරු අග්‍රාමාත්‍යතුමන්, රාජ්‍ය අමාත්‍යවරුන්, අමාත්‍යාංශයේ සියළුම කාර්යය මණ්ඩලය හා සමස්ථ රාජ්‍ය නිලධාරීන් සියළු දෙනාම වෙත කෘතඥතාවය පළ කරමි.

**එම්.එම්.පී.කේ.මායාදුන්නෙ**

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

# හැඳින්වීම

වර්ෂය ආරම්භයේදී රාජ්‍ය අමාත්‍යාංශ දෙකකකින් හා කැබිනට් අමාත්‍යාංශයක එකතුවක් ලෙස පැවති මෙම අමාත්‍යාංශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022.07.22 දිනැති සහ 2289/43 අංක දරණ අති විශේෂ ගැසට්පත්‍රය මගින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන යන අංශ ත්‍රිත්වය ඒකාබද්ධ කරමින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කැබිනට් අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

මෙම අමාත්‍යාංශයේ විෂයය පථය භාර ලේකම්වරයා ලෙස එම්.එම්.පී.කේ.මායාදුන්න මහතා කටයුතු කරන අතර, අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා මෙහි අමාත්‍යධූරය දරයි.



**අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා අමාත්‍යාංශයෙහි වැඩ භාරගත් අවස්ථාව**

අමාත්‍යාංශය යටතේ වන පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ විෂයය පථය රාජ්‍ය අමාත්‍ය ගරු ජනක වක්කුඹුර මැතිතුමන්ගේ අධීක්ෂණය යටතේ පවතින අතර සියළුම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පරිපාලන කටයුතු ක්‍රියාත්මක වන ස්වදේශ කටයුතු විෂයය පථයෙහි අධීක්ෂණ රාජ්‍ය අමාත්‍ය ගරු අශෝක ප්‍රියන්ත මැතිතුමන් විසින් දරණු ලැබේ.

**රූප සටහන - අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා**



# රාජ්‍ය පරිපාලන අංශය
# பொது நிர்வாக பிரிவு
# Public Administration Division

# පටුන


| | පිටු අංකය | | |
|---|---|---|---|
| **1. හැඳින්වීම** | **01** | **-** | **03** |
| **2. විෂයය ක්ෂේත්‍රය - මානව සම්පත් සංවර්ධන** | **04** | **-** | **09** |
| **3. විෂයය ක්ෂේත්‍රය - ප්‍රතිපත්ති** | **10** | **-** | **10** |
| **4. විෂයය ක්ෂේත්‍රය - පහසුකම් සැපයීම** | **11** | **-** | **12** |
| **5. විෂයය ක්ෂේත්‍රය - සහයක සේවා** | **12** | **-** | **15** |
| **6. විෂයය ක්ෂේත්‍රය - විශ්‍රාම වැටුප්** | **16** | **-** | **16** |
| **7. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව** | **17** | **-** | **21** |
| **8. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය** | **21** | **-** | **21** |
| **9. දූරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය** | **22** | **-** | **22** |
| **10. මානව සම්පත් සංවර්ධන කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව** | **23** | **-** | **23** |
| **11. ජාතික භාෂා අංශය** | **24** | **-** | **24** |
| **12. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව** | **25** | **-** | **25** |
| **13. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව** | **26** | **-** | **26** |
| **14. භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය** | **27** | **-** | **28** |
| **15. පාර්ලිමේන්තු කටයුතු අංශය** | **28** | **-** | **28** |
| **16. 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන්** | **29** | **-** | **29** |


**රූප සටහන් නාමාවලිය**


| | | | |
|---|---|---|---|
| රූප සටහන 1.1 | - | රාජ්‍ය පරිපාලන අංශයේ අවධානයට ලක්වූ ප්‍රමුඛ ක්ෂේත්‍රයන් | 02 |
| රූප සටහන 1.2 | - | විෂයය ක්ෂේත්‍රයන් යටතේ විවිධ අංශ ගොනු වී ඇති ආකාරය | 03 |
| රූප සටහන 2.1 | - | දීප ව්‍යාප්ත සේවාවන්හි ස්ත්‍රී සහ පුරුෂ නිලධාරී නියෝජනය | 06 |
| රූප සටහන 2.2 | - | අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන දීප ව්‍යාප්ත සේවාවන්හි සමස්ථ ස්ත්‍රී සහ පුරුෂ නිලධාරී ව්‍යාප්ත | 06 |
| රූප සටහන 4.1 | - | රජයේ සහ පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ සිදු කරනු ලබන ව්‍යාපෘති | 12 |
| රූප සටහන 5.1 | - | 2022.09.30 දින දක්වා අමාත්‍යාංශීය ජල, විදුලි, දූරකථන සහ අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් දැරූ පිරිවැය | 13 |
| රූප සටහන 5.2 | - | 2022.09.30 දින දක්වා වාහන නඩත්තු සහ ඉන්ධන පිරිවැය | 13 |
| රූප සටහන 5.3 | - | 2022.09.30 දින දක්වා අමාත්‍යාංශ තැපැල වෙනුවෙන් දරන ලද වියදම | 13 |

රූප සටහන 5.4 - ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සහ 2022.09.30 දිනට තත්‍ය වියදම 14
රූප සටහන 5.5 - පුනාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සහ 2022.09.30 දිනට තත්‍ය වියදම 14
රූප සටහන 6.1 - විනය කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ගොනු 16
රූප සටහන 7.1 - සක්‍රීය කරන ලද නව විශ්‍රාමිකයින් සඳහා ගෙවන ලද මුදල (රු.මිලියන) 19
රූප සටහන 7.2 - 2022 වසරේ විශ්‍රාම ලැබූ සංඛ්‍යාව (ජනවාරි- සැප්තැම්බර්) 19
රූප සටහන 7.3 - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් සහ ගෙවීම් (ජනවාරි-සැප්තැම්බර්) 19

**වගු නාමාවලිය**

වගුව 2.1 - ඒකාබද්ධ සහ දීපව්‍යාප්ත සේවා සඳහා කරන ලද බඳවාගැනීම් 04
වගුව 2.2 - දීපව්‍යාප්ත සේවාවන්හි ආයතනික කටයුතු 05
වගුව 2.3 - ඒකාබද්ධ සේවාවන්හි ආයතනික කටයුතු 05
වගුව 2.4 - අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ලබා දී ඇති පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශය 06
වගුව 2.5 - සේවාරම්භක පුහුණුව ලබා දීම. 06
වගුව 2.6 - කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම 07
වගුව 2.7 - අමාත්‍යාංශය වෙත ලැබී ඇති පැමිණිලි විමර්ශනයන්හි ප්‍රගතිය 19
වගුව 3.1 - රාජ්‍ය සේවයේ ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙතින් සපයන ලද දායකත්වය පිළිබඳ සමස්ත සමාලෝචනය 10
වගුව 4.1 - නිල පියස නිල නිවාස ව්‍යාපෘතිය 11
වගුව 5.1 - අභ්‍යන්තර විගණන අංශයෙහි කාර්යයන්හි ප්‍රගතිය 15
වගුව 5.2 - අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද විශේෂ විගණන පරීක්ෂණ වාර්තා 15
වගුව 6.1 - විශ්‍රාමික නිලධාරීන් සහ විශ්‍රාමික සංගම් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු සහිත ලිපි සම්බන්ධ ප්‍රගතිය 16
වගුව 6.2 - විශ්‍රාම වැටුප් අංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ, අමාත්‍ය මණ්ඩල සංදේශ සහ ගැසට් නිවේදන 16
වගුව 7.1 - සක්‍රීය කරන ලද නව විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි- සැප්තැම්බර්) 19
වගුව 7.2 - පාරිතෝෂික ගෙවීම් (ජනවාරි- සැප්තැම්බර්) 19
වගුව 7.3 - විශ්‍රාම වැටුප් විෂමතා සහ සංශෝධන (ජනවාරි- සැප්තැම්බර්) 19
වගුව 7.4 - දායක මුදල් ආපසු ගෙවීම් (ජනවාරි- සැප්තැම්බර්) 19
වගුව 7.5 - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අලුතින් එක්වූ සහ ඉවත් වූ සාමාජික සංඛ්‍යාව (ජනවාරි- සැප්තැම්බර්) 20
වගුව 7.6 - ප්‍රාග්ධන හා පුනාවර්තන වියදම් (රු.මි) 20
වගුව 7.7 - ආදායම් එකතුකිරීම් 20
වගුව 11.1 - ජාතික භාෂා අංශයෙහි ප්‍රතිපාදන සපයන ලද කාර්යයන්හි ප්‍රගතිය 24
වගුව 14.1 - ප්‍රාග්ධන ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය 27

# 1. හැඳින්වීම

සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වෙමින් ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් වෙනුවෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, රාජ්‍ය යාන්ත්‍රණය තුළ ප්‍රමුඛතම කාර්යභාර්යයක් සිදු කරනු ලබයි. එහිදී රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය පෙරදැරි කොට ගෙන ක්‍රියාත්මක වන පුළුල් විෂය පථයක් සහිත සුවිශාල කාර්යය භාරයක් අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය තුළින් ඉටු වේ. ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්ත සේවාවන් හා සමස්ත ඒකාබද්ධ සේවාවන්හි පරිපාලන කටයුතු සිදු කරමින් රාජ්‍ය සේවය තුළ මානව සම්පත වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම මෙම අංශයේ මූලික පරමාර්ථය වේ.

මහජනතාවට තෘප්තිමත් රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා සාධාරණත්වය, සමරූපිතාවය හා කාර්යක්ෂමතාවය කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් වෙමින්, පරිපාලන විධිවිධාන හා රෙගුලාසි සකස්කිරීම මෙම අමාත්‍යාංශය සතු මූලික වගකීමකි. ඒ අනුව ආයතන සංග්‍රහය හා අදාළ නව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සකස්කරමින්, සංශෝධනය කරමින්, අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධ නිරීක්ෂණ ලබා දීම ද මෙම අංශයෙන් සිදු කරනු ලබයි. රාජ්‍ය සේවා කටයුතු සම්බන්ධයෙන් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය, අර්ථකථනය හා ඒ සම්බන්ධ මාර්ගෝපදේශ සැපයීම මෙම අමාත්‍යාංශය වෙතින් ඉටුවන තවත් සුවිශේෂී කාර්යයකි. එමඟින් වඩා ඵලදායී සේවාවක් ලබා දීමට හැකිවන පරිදි සමස්ත රාජ්‍ය සේවයෙහි ම ක්‍රියාකාරීත්වය ගොඩනැගීම හා පාලනය සිදුකරනු ලබයි. රාජ්‍ය සේවයේ කාර්යය මණ්ඩල නිපුණතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීමද මෙම අමාත්‍යාංශය සතු තවත් එක් සුවිශේෂී කාර්යයභාරයකි. මීට අමතරව පාර්ලිමේන්තුව සම්බන්ධ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාළව රජය විසින් ඉටු කළ යුතු කාර්යයන් සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු මෙම අමාත්‍යාංශය මඟින් ඉටු කරනු ලබයි.

**දැක්ම**

**" දැයට විශිෂ්ඨ රාජ්‍ය සේවයක් "**

**මෙහෙවර**

**"මානව සම්පත නිසි පරිපාලනය, කළමනාකරණය හා ප්‍රතිසංස්කරණය තුළින් විශිෂ්ඨ රාජ්‍ය සේවයක් තහවුරු කිරීම "**

**රාජ්‍ය පරිපාලන අංශය වෙත පැවරී ඇති කාර්යය සහ කර්තව්‍යයන්**

- නාස්තිය හා දූෂණය පිටුදකින අයුරින් රාජ්‍ය සේවය ප්‍රතිසංස්කරණය කිරීම
- පවත්නා නීති රීති හා රෙගුලාසි සරල කිරීම
- රාජ්‍ය සේවයේ ආරවුල් විසඳීම සඳහා බේරුම්කරණ ක්‍රියාවලියක් හඳුන්වාදීම.
- රාජ්‍ය සේවක මානව සම්පත කළමනාකරණය කිරීම
- ආයතන සංග්‍රහය යටතේ වන කාර්යයන්
- රාජ්‍ය සේවා පුහුණුව ක්‍රමවත් කිරීම.
- විශ්‍රාම වැටුප් සංග්‍රහය ක්‍රියාත්මක කිරීම.
- පාර්ලිමේන්තුවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාළව රජය විසින් ඉටු කළ යුතු කාර්යයන්

**සුවිශේෂී අවස්ථා**

- **රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා අතර හමුව**

රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති යූරි බී. මැටරි මහතා හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා අතර හමුවක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ දී 2022.06.29 දින සිදු වූ අතර, වත්මන් තත්ත්වයන් හා දෙරට අතර ද්විපාර්ශික සබඳතා පිළිබඳ මෙහිදී වැඩිදුරටත් සාකච්ඡා විය.



රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති යූරි බී. මැටරි මහතා හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා අතර හමුව

- **කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (KOICA) හා අමාත්‍යාංශය අතර කොරෝනා වසංගතය තුළ අසරණ වූ පවුල් බලගැන්වීම සඳහා වන ව්‍යාපෘතියට අත්සන් තැබීම**

නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවල කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියක් කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය, එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) හා එක්ව මෙම අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද අතර, 2022.09.28 දින ත්‍රෛ පාර්ශවීය සාකච්ඡා වාර්තා ගිවිසුමකට (Record of Discussion) එළඹෙන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා කොරියානු රජය විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 6.0ක මුදලක් ලබාදීමට නියමිතය.




නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවල කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය අත්සන් තැබීම.

- **රාජ්‍ය භාෂා දිනය නිමිත්තෙන් පැවැත්වූ රචනා තරඟාවලිය**

වාර්ෂිකව ජූලි මස 01 දින සිට 05 දින දක්වා යෙදෙන රාජ්‍ය භාෂා සතිය නිමිත්තෙන් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, ජාතික භාෂා සමානාත්මතා හා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) සමඟ ඒකාබද්ධව 2022 වර්ෂයේදී පවත්වන ලද දීප ව්‍යාප්ත පාසැල් රචනා තරඟාවලිය සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම සහභාගී වී ජයග්‍රහණය කරන ලද දරු දැරියන් හට ගරු අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමන් විසින් තිළිණ සහ සහතිකපත් ප්‍රදානය කිරීම සිදු කරන ලදී.

- **රාජ්‍ය භාෂා කොමිසමේ නිල වෙබ් අඩවිය එළිදැක්වීම.**

රාජ්‍ය භාෂා කොමිසමේ නිල වෙබ් අඩවිය මෙම අමාත්‍යාංශයේ අමාත්‍යතුමන්, ලේකම්තුමන් සහ රාජ්‍ය භාෂා කොමිසමේ සභාපතිතුමන් විසින් එළිදක්වන ලදී.

- **විශ්‍රාමික රාජ්‍ය සේවකයින්ට පහසු මිලට ගෘඩ් සිටි හරහා භාණ්ඩ මිළදී ගැනීම**

විශ්‍රාමික රාජ්‍ය සේවකයින්ට පහසු මිලට ගෘඩ් සිටි වෙළඳ ජාලය හරහා භාණ්ඩ මිළදී ගැනීම සඳහා වන ගිවිසුමට අත්සන් තැබීමට මෙම වර්ෂය තුළදී හැකියාව ලැබුණි.

- **ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවාව සඳහා නවක නිලධාරීන් සඳහා පත් වීම් ලිපි ප්‍රදානය**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය සඳහා සීමිත පදනමින් බඳවා ගන්නා ලද නිලධාරීන් දස දෙනෙකු සඳහා පත්වීම් ලිපි ප්‍රදානය මෙම අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන් සහ ලේකම්තුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

**රූප සටහන 1.1 - රාජ්‍ය පරිපාලන අංශයේ අවධානයට ලක්වූ ප්‍රමුඛ ක්ෂේත්‍රයන්**



අමාත්‍යාංශයට පැවරී ඇති විෂයය පරාසය යටතේ ඉටු කරනු ලබන කාර්යයන් සැලකිල්ලට ගනිමින් ප්‍රධාන විෂයය ක්ෂේත්‍ර 7ක් ඔස්සේ ඒවා ගොනුකර ඇති අතර, ඊට අමතරව ඉහත ප්‍රමුඛ ක්ෂේත්‍රයන් සඳහා සහය සැපයීම වෙනුවෙන් සහයක සේවා යටතේ තවත් අංශ පහක් සේවා සැපයීමේ කටයුතු සිදු කරනු ලබයි.

ඒ ඒ කාර්යයන් ඉටු කරනු ලබන අදාළ අංශ ද එම ප්‍රමුඛ ක්ෂේත්‍රයන් යටතෙහි ම ලා සලකමින් අමාත්‍යාංශය අත්පත් කරගෙන ඇති ප්‍රගතිය ඒ ඔස්සේ අධීක්ෂණය කිරීම සිදු කරයි.

ඒ ඒ ප්‍රමුඛ ක්ෂේත්‍රයන් යටතට ගොනු කරනු ලබන අංශයන් පහතින් දැක්වේ.

**රූප සටහන 1.2 - විෂයය ක්ෂේත්‍රයන් යටතේ විවිධ අංශ ගොනු වී ඇති ආකාරය**



# 2. විෂයය ක්ෂේත්‍රය - මානව සම්පත් සංවර්ධනය

රාජ්‍ය සේවා අංශය යටතේ, ප්‍රධාන වශයෙන්ම දීපව්‍යාප්ත සේවාවන් සහ සියළුම ඒකාබද්ධ සේවාවන් සඳහා නවක නිලධාරීන් බඳවා ගැනීම, මානව සම්පත නිසි ලෙස පරිපාලනය හා කළමනාකරණය කිරීම ඔස්සේ ආංශික කාර්යය සාධන දර්ශකයන් සපුරා ගැනීම යන ඉලක්කයන් ඔස්සේ ක්‍රියාත්මක වන සියළුම අංශයන් මෙම විෂයය ක්ෂේත්‍රය යටතේ සලකනු ලබයි.

**වගුව 2.1 - ඒකාබද්ධ සහ දීපව්‍යාප්ත සේවා සඳහා කරන ලද බඳවාගැනීම්**

| සේවා අංශය | වාර්ෂිකව බඳවාගත් ප්‍රමාණයන් | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
| **දීපව්‍යාප්ත සේවා** | | | | | | |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 132 | - | 221 | - | 253 | 01 |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 22 | 16 | 36 | - | 32 | - |
| ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවාය | 11 | 01 | - | 1 | - | 10 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 13 | - | 232 | - | 133 | - |
| ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | - | - | 106 | - | - | - |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | - | 226 | 34 | 30 | 223 | 71 |
| **ඒකාබද්ධ සේවා** | | | | | | |
| කළමනාකරණ සේවා නිලධාරි සේවය | 1,050 | 5427 | 288 | - | - | - |
| භාෂා පරිවර්තක සේවය | - | - | - | - | - | - |
| පුස්තකාලයාධිපති සේවය | - | 33 | 13 | - | - | - |
| තොරතුරු තාක්ෂණ සේවය | 52 | 9 | 503 | 211 | - | - |
| සංවර්ධන නිලධාරි සේවය | - | 1,922 | - | 58,227 | 10,270 | 22,940 |
| කාර්යාල සේවක සේවය | 936 | 1,111 | 986 | 1,249 | 431 | - |
| රියදුරු | 379 | 811 | 209 | 175 | 86 | - |
| වාර්ෂික බඳවාගැනීම් සංඛ්‍යාව | **2,595** | **9,556** | **2,628** | **59,893** | **11,428** | **23,012** |

ඉහත සඳහන් සියළුම සේවාවන් වෙත බඳවාගන්නා ලද මානව සම්පත වඩාත් ඵලදායි ලෙස කළමනාකරණය කිරීම අරමුණු කරගනිමින් සිදු කරන ලද ආයතනික කටයුතුවල සමස්ත සාරාංශය දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවා මට්ටමින් පහත පරිදි දැක්විය හැකිය.

**දීපව්‍යාප්ත සේවා**

අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන දීපව්‍යාප්ත සේවාවන් පහෙහි 2022.09.30 දක්වා ආයතනික කටයුතු පහත පරිදි සිදු වී ඇත.

## වගුව 2.2 - දීපව්‍යාප්ත සේවාවන්හි ආයතනික කටයුතු

| කාර්යයන් | දිපව්‍යාප්ත සේවාවන් (2022.09.30 දිනට) | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී.ලං.ග.සේ | ශ්‍රී.ලං.ක්‍ර.සේ | ශ්‍රී.ලං.ඉ.සේ | ශ්‍රී.ලං.ප.සේ | ශ්‍රී.ලං.වි.සේ | ශ්‍රී.ලං.වා.වි.සේ | ශ්‍රී.ලං.තා.සේ |
| **කාර්යය මණ්ඩලය** | | | | | | | |
| අනුමත සංඛ්‍යාව | 2,102 | 1,184 | 1,565 | 3,319 | 641 | 75 | 15,592 |
| තත්‍ය සංඛ්‍යාව | 1,681 | 1,096 | 1,370 | 2,618 | 434 | 53 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය සඳහා බඳවාගැනීම් සහ ආයතනික කටයුතු ඊට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන අතර, ප්‍රතිපත්ති තීරණ ගැනීම මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. |
| නව බඳවාගැනීම් | 25* | - | 71** | 01 | - | 10 | |
| ස්ථිර කිරීම් | 79 | 18 | 119 | - | 25 | 10 | |
| **උසස් කිරීම්** | | | | | | | |
| III සිට II | 88 | 58 | 62 | 85 | 35 | 10 | |
| II සිට I | 80 | - | 20 | 163 | 24 | 09 | |
| I සිට විශේෂ/අධි ශ්‍රේණියට | 84 | 10 | 19 | 07 | 15 | - | |
| විශ්‍රාම යාම් | 01 | 02 | 11 | 37 | 05 | 01 | |
| වාර්ෂික නොවන ස්ථාන මාරු | 65 | 39 | 44 | 08 | - | 03 | |
| වාර්ෂික ස්ථාන මාරු | 07 | 17 | - | 254 | - | - | |
| මුදාහැරීම් | 05 | 01 | 01 | 145 | 02 | - | |
| **විනය කටයුතු** | | | | | | | |
| විනය කටයුතු ආරම්භ කරන ලද සංඛ්‍යාව | 06 | 03 | 05 | 23 | 01 | - | |
| චෝදනා පත්‍ර නිකුත් කිරීම/නිදහසට කරුණු විමසීම | 06 | 02 | 02 | 15 | 08 | - | |
| විනය නියෝග නිකුත් කිරීම | 03 | 01 | 05 | 10 | 01 | - | |
| සේවා අත්හැරයාමේ නිවේදනවලට එරෙහිව කරන ලද අභියාචනා | - | - | - | 02 | 01 | - | |

***මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමුකර ඇත.**

****2021 වර්ෂයට අදාළව පවත්වන ලද විවෘත බඳවා ගැනීමේ දෙවන අදියර වශයෙන් 2022.04.04 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි III වන ශ්‍රේණියට පත්වීම් ලබා දී ඇත.**

## වගුව 2.3 - ඒකාබද්ධ සේවාවන්හි ආයතනික කටයුතු

| කාර්යය | භාෂා පරිවර්තක සේවය | පුස්තකාලයාධිපති සේවය | සංවර්ධන නිලධාරී සේවය | කළමනාකරණ සේවා නිලධාරී සේවය | රියදුරු සේවය | කාර්යාල කාර්ය සහයක සේවය | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය 1 පන්තිය | 2 පන්තිය | 3 පන්තිය |
|---|---|---|---|---|---|---|---|---|---|
| **කාර්යය මණ්ඩලය** | | | | | | | | | |
| අනුමත සංඛ්‍යාව | 636 | 625 | 85,585 | 29,785 | | - | 135 | 487 | 2,666 |
| තත්‍ය සංඛ්‍යාව | 251 | 121 | 82,000 | 24,508 | 8,491 | 17,469 | 63 | 255 | 1,444 |
| නව බඳවාගැනීම් | - | - | 20,697 | - | - | 444 | - | - | - |
| ස්ථිර කිරීම් | 07 | 01 | 3,116 | 1542 | 158 | 762 | 5 | 9 | 11 |
| **උසස් කිරීම** | | | | | | | | | |
| III සිට II | - | 09 | 433 | 1,722 | 56 | 321 | 1 | 1 | 148 |
| II සිට I | - | 04 | 68 | 399 | 28 | 112 | | | |
| I සිට විශේෂ/ අධි ශ්‍රේණියට | - | - | - | - | 28 | 172 | | | |
| විශ්‍රාම යාම් | 02 | 03 | 15 | 337 | 43 | 112 | - | - | 9 |
| වාර්ෂික නොවන ස්ථාන මාරු | 10 | - | 1,743 | 1,217 | 236 | 252 | 3 | 2 | 21 |
| වාර්ෂික ස්ථාන මාරු | 06 | - | 412 | 1,286 | 176 | 633 | - | 8 | 76 |
| මුදාහැරීම් | 01 | 01 | 406 | 141 | - | 77 | - | 2 | 4 |
| **විනය කටයුතු** | | | | | | | | | |
| විනය කටයුතු ආරම්භ කරන ලද සංඛ්‍යාව | - | - | 53 | 17 | 21 | 18 | 01 | - | 02 |
| චෝදනා පත්‍ර නිකුත් කිරීම/නිදහසට කරුණු විමසීම | - | - | 36 | 16 | 10 | 07 | - | - | - |
| විනය නියෝග නිකුත් කිරීම | - | - | 03 | 19 | 03 | 05 | - | - | - |
| සේවා අත්හැරයාමේ නිවේදනවලට එරෙහිව කරන ලද අභියාචනා | - | - | 08 | 02 | 02 | 09 | - | - | - |

දීපව්‍යාප්ත සේවාවන්ට බඳවාගැනීමේදී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සමාන අවස්ථා සලසා ඇති අතර, ස්ත්‍රී පුරුෂ භාවය අනුව නිලධාරීන්ගේ ව්‍යාප්තිය පහත ප්‍රස්තාරයන්හි නිරූපණය වේ.

**රූප සටහන 2.1 - දීප ව්‍යාප්ත සේවාවන්හි ස්ත්‍රී සහ පුරුෂ නිලධාරී නියෝජනය**




**රූප සටහන 2.2 - අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන දීප ව්‍යාප්ත සේවාවන්හි සමස්ථ ස්ත්‍රී සහ පුරුෂ නිලධාරී ව්‍යාප්තිය**




## 2022 වර්ෂයේ සුවිශේෂී කාර්යයසාධනයන්

- **අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.**

අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් හැකිතාක් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීමට කටයුතු කර ඇත.

අමාත්‍යාංශයේ සේවයේ නියුතු ද්විතීය මට්ටමේ නිලධාරීන් සඳහා පැය 150 ක දෙමළ භාෂා පුහුණු පාඨමාලාව (18/2020 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව) මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සම්පත්දායකත්වය යටතේ කණ්ඩායම් 03ක් සඳහා අංශයේ ප්‍රධානතම පුහුණු වැඩසටහන වශයෙන් ක්‍රියාත්මක වන අතර, පළමු කණ්ඩායම පාඨමාලාව අවසන්ව දෙවන සහ තුන්වන කණ්ඩායම් පාඨමාලා අවසන් අදියරේ පවත්වාගෙන යනු ලබයි.

කළමනාකරණ හා කළමනාකරණ නොවන සේවා කාණ්ඩ සඳහා දේශීයව, විදේශීයව හා කෙටි කාලීනව හා දිගු කාලීනව 2022.09.30 දින දක්වා ලබා දෙන ලද පුහුණුවීම් පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

**වගුව 2.4 - අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ලබා දී ඇති පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශය**

| සේවා ගණය | දේශීය පුහුණු පාඨමාලා | | විදේශීය පුහුණු පාඨමාලා | |
|---|---|---|---|---|
| | කෙටි කාලීන | දිගු කාලීන | කෙටි කාලීන | දිගු කාලීන |
| කළමනාකරණ | 10 | - | 02 | 02 |
| කළමනාකරණ නොවන | 29 | - | - | - |
| ප්‍රාථමික | 10 | - | - | - |

- **නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු ලබාදීම**

**වගුව 2.5 - සේවාරම්භක පුහුණුව ලබා දීම.**

| සේවාව | සේවාරම්භක පුහුණුව ලබා දීම |
|---|---|
| **දීපව්‍යාප්ත සේවා** | |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 2021 වර්ෂය තුල බඳවාගත් III ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු වැඩසටහනෙහි මොඩියුල 6ක් සම්පූර්ණ කර ඇති අතර මොඩියුල 3ක් ඉදිරි කාර්තුවේදී සම්පූර්ණ කිරීමට නියමිතය |
| **ඒකාබද්ධ සේවා** | |
| ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණිය | නවක නිලධාරීන් 14 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණුව සැප්තැම්බර් මස පවත්වා ඇත. |
| සංවර්ධන නිලධාරී සේවය | 2020, 2021 සහ 2022 වර්ෂවල නවක සංවර්ධන නිලධාරීන් ලෙස පත්වීම් ලබා මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් 02 ක් පවත්වා ඇත. |



නවක සංවර්ධන නිලධාරීන් හට සේවාරම්භක පුහුණුව ලබාදීම

- රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020 යටතේ බඳවාගනු ලැබූ උපාධිධාරී අභ්‍යාසලාභීන් සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවාගැනීම සහ අභ්‍යාසලාභීන් 49,053 දෙනෙකු රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී තනතුරු සඳහා පත් කර ඇත
- වාර්ෂික ස්ථාන මාරු මෙන්ම කළමනාකරණ සේවා නිලධාරි හා සංවර්ධන නිලධාරින් සඳහා වාර්ෂික නොවන ස්ථාන මාරු ද මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සිදු කිරීමට කටයුතු කර ඇත.
- ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක MSO/01 EB(GENERAL) හා 2021.06.28 දිනැති ලිපිය අනුව කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරින් 516දෙනෙකු අදාළ පුහුණුව සම්පූර්ණ කළ පසු කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කර ඇත.
- ඒකබද්ධ සේවයේ සියළු නිලධාරින්ගේ ආයතනික කටයුතු සම්බන්ධ අඩුපාඩු කැදවීම මාර්ගගතව සිදු කිරීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති නිලධාරීන්ගේ අන්තර්ග්‍රහණ කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නවක නිලධරයින් සඳහා පවත්වන ලද සේවාරම්භක පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කරන ලද නිලධාරීන්ගේ කලා කුසලතා ඔප් නංවීමේ විවිධ ප්‍රසංගයක් සමඟ සහතිකපත් ප්‍රදානය සිදු කර ඇත.



**ශ්‍රී.ලං.වි.සේ. නවක නිලධරයින් සඳහා පවත්වන ලද සේවාරම්භක පුහුණු පාඨමාලාව සඳහා සහතිකපත් ප්‍රදානය**

- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නවක නිලධාරීන් විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත ඔසු උයනක් පිරිනැමීම



**ශ්‍රී.ලං.වි.සේ. නවක නිලධාරීන් විසින් SLIDA වෙත ඔසු උයනක් පිරිනැමීම.**

වගුව **2.6 - කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම**

| සේවාව | ප්‍රගතිය |
|---|---|
| **ශ්‍රී ලංකා පරිපාලන සේවය**<br>**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය**<br>**ශ්‍රී ලංකා විද්‍යාත්මක හා වාස්තු විද්‍යාඥ සේවය**<br>**ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය**<br>**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය** | – මෙම සියළුම සේවාවන්හි **“පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2019 (I) ”** සහ<br>– ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරින් සඳහා වන **“දෙවන කාර්යක්ෂමතා කඩඉම 2019 (II)”** පරීක්ෂණයන්ට අදාළ විභාග නිවේදන ඔක්තෝබර් මස ගැසට් පත්‍රයේ පළ කරන අතර විභාගය 2022.11.05 දින සිට 2022.11.26 දින දක්වා පැවැත්වීමට නියමිතය. |
| **ශ්‍රී ලංකා තාක්ෂණ සේවය** | – මෙම සේවයේ III හා II ශ්‍රේණීන්ට අදාළ **“කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 (I)”** සඳහා 2022.09.13 දින ප්‍රතිඵල නිකුත් කර ඇත.<br>– මෙම සේවයේ III හා II ශ්‍රේණීන්ට **අදාළ “කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 (II)”** සඳහා 2022.11.21 දින වන විට අයදුම්පත් භාරගැනීම අවසන් කිළුීමට නියමිතව ඇති අතර,<br>– I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය වෙනුවෙන් 2022.12.31 දින දක්වා අයදුම්පත් කැඳවීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | – | I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණිය සඳහා උසස් කිරිමට අදාළ සීමිත තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවා අවසන් කර ඇත. |
| **පුස්තකාලයාධිපති සේවය (III) ශ්‍රේණිය**<br>**පුස්තකාලයාධිපති සේවය (II) ශ්‍රේණිය** | – | අදාළ **"කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 (II) 2022 "**ටඅදාළ විභාග නිවේදන නිරීක්ෂණ ලබා ගැනීම සඳහා 2022.02.09 දින විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| **කළමනාකරණ සේවා නිලධාරි සේවය (I) ශ්‍රේණිය** | – | **"කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2016 (I) 2022"** ට අදාළ විභාග නිවේදනය නිරීක්ෂණ ලබා ගැනීම සඳහා 2022.06.21 දින විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| **කළමනාකරණ සේවා නිලධාරි සේවය (II) ශ්‍රේණිය** | – | **"කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2014 (I ) 2022"** විභාගයට අදාළ විභාග නිවේදනය 2022.02.25 දින ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර ජූනි මස විභාගය පැවැත්වීමට නියමිතව තිබුන ද විභාග දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් එය පවත්වා නොමැත. |
| **කළමනාකරණ සේවා නිලධාරි සේවයේ (III) ශ්‍රේණිය** | – | **"කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 (II) 2022"** විභාගයට අදාළ විභාග නිවේදනය 2022.02.25 දින ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර ජූනි මස විභාගය පැවැත්වීමට නියමිතව තිබුනද විභාග දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් එය පවත්වා නොමැත. |
| **සංවර්ධන නිලධාරි සේවය** | – | **"පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2016 (I) 2021"** සහ **"දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 (I) 2021"** විභාගයන්ට අදාළ විභාග නිවේදනය 2021.10.29 දිනැති ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර විභාග දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් එය පවත්වා නොමැත. |
| **කළමනාකණ සහකාර (තාක්ෂණික නොවන)** | – | කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 2 සේවා ගණයේ නිවාඩු නිකේතන පරිපාලක තනතුර සහ දත්ත සටහන්කරු තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2022.03.10 දින පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇත. |
| | – | කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයට අයත් තාක්ෂණ සහයක තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2022.09.30 දින පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇත. |

**ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන්**

- ඒකාබද්ධ සේවයේ සියළු නිලධාරින් සඳහා වාර්ෂික නොවන ස්ථාන මාරු සහ විශ්‍රාම ගැන්වීම් මාර්ගගතව ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම.
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාග 2021 ට අදාළ විභාගය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පැවැත්වීමටත්, කුසලතා පදනම මත 2013(2021) තරග විභාගයට අදාළ නිලධාරීන් 12 දෙනෙකු බඳවාගැනීමටත්, 2014(2016) තරග විභාගයට අදාළ විභාග නිවේදනය පළ කිරීමටත් නියමිතව ඇත.
- ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ 1පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2018 ට අදාළව සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් ලද නිලධාරීන් 05 දෙනෙකු මුදල් අමාත්‍යාංශයේ එකඟතාව ලද පසු බඳවාගැනීමට නියමිතය.
- කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාග - 2019(2020)ට අදාළව මුදල් අමාත්‍යාංශයේ එකඟතාව ලද පසු සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවාගැනීම සිදුකිරීමට නියමිතය.
- කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියේ කුසලතා පදනමින් උසස් කිරීමේ තරග විභාගය 2019(2020) ට අදාළ ව යෝග්‍යතාව සඳහා ලකුණු ලබා දීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර අනුමැතිය

ලද පසු බඳවාගැනීම සිදු කිරීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් සීමිත තරග විභාගය පැවැත්වීමට කටයුතු කළ යුතුව ඇත.

- රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවාගැනීමේ සීමිත තරග විභාග 2019(2020) අදාළව ප්‍රතිඵල නිකුත් වූ පසු මුදල් අමාත්‍යාංශයේ එකඟතාව ලබාගෙන බඳවාගැනීම සිදුකිරීමට නියමිතය
- රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියට බඳවාගැනීමේ තරග විභාගය 2019(2020) අදාළව ප්‍රතිඵල නිකුත් වූ පසු මුදල් අමාත්‍යාංශයේ එකඟතාව ලබාගෙන බඳවාගැනීම සිදු කෙරේ.
- ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම, ශ්‍රේණි උසස් කිරීම, තනතුරට විධිමත් පරිදි පත් කිරීම, තනතුරුවලට වැඩ බැලීම රාජකාරි ඉටුකිරීම / සහ වාර්ෂික නොවන ස්ථාන මාරු අයදුම්පත්‍ර යොමු කිරීම ආදී පරිපාලන කටයුතු මාර්ග ගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක කිරීමට හඳුන්වාදුන් නව තොරතුරු කළමනාකරණ පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කරමින් පවත්වාගෙන යාම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2022 අනුව නව ක්‍රමවේදය යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම.
- 2022.09.08 වන දින ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියට අයත් තනතුරු 04ක් සඳහා නිලධාරීන් පත්කිරීමට අදාළව, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවා සුදුසුකම් ලත් නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා පවත්වනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය 2022.11.01 වන දින පැවැත්වීමට සැලසුම් කර ඇත.
- ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය සඳහා සීමිත පදනමින් බඳවා ගත් නිලධරයින් ක් සඳහා 10 සේවාරම්භක පුහුණුව ලබා දීමට නියමිතව ඇත.
- ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධරයන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 නිකුත් කිරීමට පෙර පැවති උසස්වීම් ක්‍රමවේදය නැවත හඳුන්වාදීම සඳහා කැබිනට් සංශෝධනයට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිරීක්ෂණ හා යෝජනා යොමු කිරීම.
- තොරතුරු දැනගැනීමේ පනතේ විධිවිධාන පරිදි 2022.06.01 දින සිට 2022.09.30 දින දක්වා ඉල්ලීම් 39ක් ලැබී ඇති අතර, ඉන් ඉල්ලීම් 27ක් සඳහා පිළිතුරු සපයා ඇත. 2020 සහ 2021 වර්ෂයන් වලින් ඉදිරියට ගෙන එන ලද ඉල්ලීම් සංඛ්‍යාව 15කි.
- රාජ්‍ය සේවයේ ආරවුල් විසදීමට ක්‍රමවේදයක් ඇති කිරිමට අදාළව සේවක ව්‍යවස්ථා සැකසීම සඳහා සාකච්ජාවක් පැවැත්වුණු අතර, බේරුම්කරණය සම්බන්ධව සියළුම ලේකම්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් මෙම අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ ප්‍රධානත්වනේ පවත්වන ලදී.

- **වගුව 2.7 - අමාත්‍යාංශය වෙත ලැබී ඇති පැමිණිලි විමර්ශනයන්හි ප්‍රගතිය**

| වර්ෂය | පැමැණිලි සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | ලැබුණු / කටයුතු කරමින් පවතින | සම්පූරණ කරන ලද | අත්හිටුවන ලද |
| **2020** | 2 | 2 | - |
| **2021** | 2 | 1 | 1 |
| **2022** | 9 | 2 | 3 |
| එකතුව | **13** | **5** | **4** |

***කටයුතු කරමින් පවතින පැමිණිලි සංඛ්‍යාව 04කි.***

- තොරතුරු දැනගැනීමේ පනත සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරිමේ වැඩසටහනක් පැවැත්වූ අතර, ඒ සඳහා නිලධාරීන් 40දෙනෙකු සම්බන්ධ වී ඇත.

# 3. විෂයය ක්ෂේත්‍රය - ප්‍රතිපත්ති

**ආයතන අංශය**

රාජ්‍ය සේවකයන් සම්බන්ධයෙන් සහ රාජ්‍ය සේවයේ යහපැවැත්ම සහතික වන අයුරින් ඊට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා රජයට සහය වීම ආයතන අංශයේ ප්‍රධාන කාර්යය වන බැවින්, ඊට අදාළ කටයුතු ඉටු කිරීමේදී හා බලතල ක්‍රියාත්මක කිරීමේදී ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි ප්‍රධාන වශයෙන්ම ආධාර කර ගනී.

**2022 වර්ෂයේ සුවිශේෂී කාර්යය සාධනයන්**

- **වගුව 3.1 - රාජ්‍ය සේවයේ ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙතින් සපයන ලද දායකත්වය පිළිබඳ සමස්ත සමාලෝචනය**

| සිදු කරන ලද කාර්යයන් | සංඛ්‍යාව |
|---|---|
| නිකුත් කරන ලද චක්‍රලේඛ සංඛ්‍යාව | 18 |
| සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සංඛ්‍යාව | 03 |
| නිකුත් කරන ලද චක්‍රලේඛ ලිපි සංඛ්‍යාව | 04 |
| යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 08 |
| අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා සකස් කරන ලද නිරීක්ෂණ ගණන | 136 |
| සේවා ව්‍යවස්ථා සඳහා ලබා දුන් නිරීක්ෂණ ගණන | 01 |
| බඳවා ගැනීම් පරිපාටි සඳහා ලබා දුන් නිරීක්ෂණ ගණන | 20 |

- **ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම**

2013 වර්ෂයේදී සංශෝධිතව නිකුත් කරන ලද ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩය සඳහා 2012 වසරෙන් පසුව සිදුකර ඇති සංශෝධන ද ඇතුළත් කරමින් පරිච්ඡේද 29 කින් සමන්විත වන පරිදි ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩය නැවත සංශෝධන කිරීමට කටයුතු කරමින් පවතින අතර, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ සංශෝධන කටයුතු පූර්ණ වශයෙන් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. 2013 ආයතන සංග්‍රහය දමිළ මාධ්‍ය භාෂා පරිවර්තනය සිදු කිරීමේ කටයුතු වල අවසන් සංස්කරණ හා සෝදුපත් පරීක්ෂාව මේ වන විට සිදු කරමින් පවතින අතර, ඉංග්‍රීසි භාෂා පරිවර්තන කටයුතු වල නැවත සෝදුපත් පරීක්ෂා කිරීම් සිදු කරමින් පවතී.

- **තොරතුරු පනතට අදාළව යොමු කරන ලද ගැටළු**

මෙම වර්ෂය තුළ ලැබී ඇති ඉල්ලීම් 49ක් ලැබී ඇති අතර, එම සියළුම ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දක්වා ඇත.

- **වන්දි අනුමත කිරීම**

මෙම වර්ෂය තුලදී 2022.09.30 දක්වා වන්දි අනුමත කරන ලද වන්දි ගොනු 120ක් සඳහා රු.මිලියන 95.8ක වන්දි මුදලක් ප්‍රදානය කර ඇත.

- **ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය නිලධරයන් දැනුම්වත් කිරීම**

රාජ්‍ය නිලධාරීන් 90 දෙනෙකු සඳහා 2022.03.23 හා 2022.03.24 දින දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
මෙම වර්ෂය තුළදී පුහුණු වැඩසටහන් 03ක් පැවැත්වීමට අපේක්ෂා කළද, වර්ෂය මැදදී පුහුණු වැඩසටහන් පැවැත්වීම මානව සම්පත් අංශය වෙත පැවරුණු බැවින් අවශ්‍ය අවස්ථාවන්හිදී මෙම අංශයේ මාණ්ඩලික නිලධාරීන් ඒ සඳහා සම්පත් දායකත්වය ලබා දේ.

- **ලිපි ගොනු කළමනාකරණ පද්ධතිය**

ලිපිගොනු පහසුවෙන් හඳුනා ගැනීමට හා රාජකාරි කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීම සඳහා අංශය තුළ පවතින ලිපි ගොනු විධිමත් පරිදි ගබඩා කිරීම සිදුකරමින් ඒ සම්බන්ධව දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී.

- **වන්දි දත්ත පද්ධතිය**

වන්දි ඉල්ලීම් සම්බන්ධ සියලුම විස්තර හා ඊට අදාළව ගනු ලබන පොදු තීරණ ඇතුලත් කරමින් දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී.

- **ලැබෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම**

විවිධ ආයතන විසින් ලිපි 4,143ක් යොමු කර ඇති අතර, ඉන් 98%ක් සඳහා එනම් ලිපි 4,041ක් සඳහා පිළිතුරු ලිපි යොමු කර ඇත.

# 4. විෂයය ක්ෂේත්‍රය - පහසුකම් සැපයීම

### නිවාස හා සංවර්ධන අංශය

රාජ්‍ය නිලධාරීන්ට නිල නිවාස පහසුකම් සැපයීමේ අරමුණ පෙරදැරිව, රජයේ නිල නිවාස වෙන් කිරීම හා පරිපාලනය, දිවයින පුරා නව නිල නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, රජයේ නිවාඩු බංගලා හා නිකේතන වෙන් කිරීම හා පරිපාලනය සහ නිවාස හිමි නොවූ රජයේ නිලධාරීන් වෙත මහල් නිවාස ලබා දීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන මූලික කාර්යයන් හා ඊට අදාළ සෙසු සියලු රාජකාරි කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරේ

**වගුව 4.1 - නිල පියස නිල නිවාස ව්‍යාපෘතිය**

| නිල පියස නිවාස ව්‍යාපෘතිය - ඒකාබද්ධ අරමුදල | | | | | | |
|---|---|---|---|---|---|---|
| **දිස්ත්‍රික්කය** | **මුළු පිරිවැය (රු. මි.)** | **උපදේශන සේවා ආයතනය** | **ඉදිකිරීම් ආයතනය** | **නිවාස ඒකක ගණන** | **මූල්‍ය ප්‍රගතිය (රු. මි)** | **භෞතික ප්‍රගතිය** |
| **මොණරාගල අදියර I හා II** | 345 | ඌව පළාත් සහා ඉන්ජිනේරු ඒකකය | සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් පුද්. සමාගම | 32 | 295.15 | 100% |
| **ගම්පහ අදියර I හා II** | 610 | බස්නාහිර පළාත් සභා ඉන්ජිනේරු ඒකකය | අදියර I සඳහා - ලින්ක් ඉන්ජිනියරින් පුද්. සමාගම<br>අදියර II සඳහා - සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් පුද්. සමාගම | 32 | 486.94 | 98.2% |
| **පොළොන්නරුව** | 375 | මොරටුව විශ්වවිද්‍යාලය | ලින්ක් ඉන්ජිනියරින් පුද්. සමාගම | 32 | 177.52 | මුදල් අමාත්‍යාංශයේ 03/2022 චක්‍රලේඛයේ උපදෙස් පරිදි ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරමින් පවතී. |

.






**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

♦ **රජයේ නිල නිවාස**

මෙම අමාත්‍යාංශය මඟින් පාලනය වන පහත නිල නිවාස ගරු අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, රජයේ මාණ්ඩලික නිලධාරීන් සහ රජයේ මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ පදිංචිය සඳහා වෙන්කර දීමට කටයුතු කරනු ලබයි.

- කැප්පෙටිපොල මාවත සමුළු නිවාස (නිවාස 104)
- බංගලා නිවාස (නිවාස 50)
- ජයවඩනගම නිවාස (නිවාස 18)
- ලොරිස් පටුමඟ නිවාස සංකීර්ණය (නිවාස 20)
- කොළඹ 08, ගෝතමී පාර නිවාස (නිවාස 02)
- කොළඹ 07 "නිල පියස" නිවාස සංකීර්ණය (නිවාස 40)

**රූප සටහන 4.1 - රජයේ සහ පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ සිදු කරනු ලබන ව්‍යාපෘති**




- ♦ **නිවාඩු බංගලා හා නිවාඩු නිකේතන**

රජයේ සේවකයන්ගේ සුභ සාධනය අරමුණින් මෙම අංශය යටතේ දිවයින පුරා විසිරී ඇති රජයේ සංචාරක බංගලා 08ක් ද, නිවාඩු නිකේතන 07ක් ද ක්‍රියාත්මක වේ.

**2022 වර්ෂයේ අත්පත් කර ගන්නා ලද සුවිශේෂී ඉලක්ක සහ ජයග්‍රහණ**

- ♦ මෙම අමාත්‍යාංශයට අයත් යාපනය නිවාඩු නිකේතනය සහ බණ්ඩාරවෙල සංචාරක බංගලාව පිහිටි ඉඩම් මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමේ කටයුතු මේ වන විට අවසන්ව ඇත.
- ♦ රජයේ මාණ්ඩලික නිලධාරීන්ගේ පදිංචිය සඳහා වෙන්කර දීමට කටයුතු කරනු ලබන මෙම අමාත්‍යාංශයට අයත් "සමුළු නිවාස" වෙන්කිරීමේදී 2022.09.15 දිනැති අංක 20/2022 චක්‍රලේඛය ප්‍රකාරව නව නිවාස ප්‍රතිපත්තියක් ඇති කිරීම සහ ඒ අනුව 2023 වර්ෂය සඳහා නිවාස අයදුම්පත්‍ර කැඳවීම ආරම්භ කර ඇත.
- ♦ මෙම අමාත්‍යාංශයට අයත් නිවාඩු නිකේතන සහ සංචාරක බංගලා වෙන්කිරීමේ කටයුතු මෙම වර්ෂයේ සිට මාර්ගගත ක්‍රමය ඔස්සේද සිදුකිරීම.

**වර්ෂය තුළදී ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන්**

- ♦ කොළඹ 07, "නිල පියස" නිවාස සංකීර්ණයෙහි දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් වෙත කාමර 03ක් නිවාඩු නිකේතනයක් බවට පත් කිරීම
- ♦ මහනුවර, අස්ගිරිය "නිල පියස" නිවාස සංකීර්ණයෙහි කාමර 03 බැගින් වූ සංචාරක බංගලා 02 ක් සකස්කිරීම.
- ♦ මේ වන විට ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන්ව නොමැති සංචාරක බංගලා සහ නිවාඩු නිකේතනයන්හි ඉඩම් පවරාගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීම.

## 5. විෂයය ක්ෂේත්‍රය - සහයක සේවා

අමාත්‍යාංශයේ විෂයය පථයට පැවරී ඇති කාර්යයන් ඉටු කරන සියලුම අංශ සඳහා අවශ්‍ය මූල්‍ය, යටිතල පහසුකම්, තොරතුරු තාක්ෂණ පහසුකම් සහ නියමිත නිති හා රෙගුලාසි අනුව කටයුතු සිදු කරන්නේද යන්න සොයා බැලීමේ යාන්ත්‍රණය ආදී පහසුකම් අවශ්‍ය පරිදි ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව සපයාදීමේ කාර්යය ඉටු කරනු ලබන පහත අංශ මේ යටතේ සලකනු ලබයි.

- අභ්‍යන්තර පාලන අංශය
- මූල්‍ය අංශය
- තොරතුරු තාක්ෂණ අංශය
- අභ්‍යන්තර විගණන අංශය

**අභ්‍යන්තර පාලන අංශය**

එක් එක් අංශ අතර මනා සම්බන්ධතාවක් ගොඩනගමින් ඔවුන්ගේ කාර්යය මණ්ඩලය වෙත අවශ්‍ය යටිතල පහසුකම් ලබාදෙමින් හා ආයතන පරිශ්‍රයේ යහපැවැත්ම ඇතිකරමින්, අමාත්‍යාංශය වෙතින් මහජනතාවට හා සේවාවන් බලාපොරොත්තුවෙන් පැමිණෙන පාර්ශවයන්ට සුදුසු මඟපෙන්වීම හා සහයෝගය ලබා දීමට හැකි පරිසරයක් සකස් කිරීම මෙම අංශය වෙතින් ඉටු කරනු ලබයි.

## 2022 වසරේ සුවිශේෂී කාර්යය සාධනයන්

- අමාත්‍යාංශයේ එදිනෙදා කාර්යයන් පවත්වාගෙන යාම සඳහා සැපයිය යුතු පහසුකම් වන විදුලිය, ජලය, දුරකථන, අන්තර්ජාල පහසුකම්, තැපැල, ඉන්ධන සැපයීම සහ වාහන නඩත්තු වෙනුවෙන් අමාත්‍යාංශය දැරිය යුතු මාසික සාමාන්‍ය පිරිවැය රු.මිලියන 3.9ක් වේ.
- එයින්, අමාත්‍යාංශයේ මූලික යටිතල පහසුකම් වන විදුලිය, දුරකථන (අන්තර්ජාල පහසුකම්ද සහිතව) සහ ජලය සැපයීම සඳහා මාසිකව දරන ලද පිරිවැය පිළිබඳ විස්තර පහතින් දැක්වේ

**රූප සටහන 5.1 – 2022.09.30 දින දක්වා අමාත්‍යාංශීය ජල, විදුලි, දුරකථන සහ අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් දැරූ පිරිවැය**




- අමාත්‍යාංශය සතු වාහන නඩත්තු කටයුතු සහ ඉන්ධන සඳහා රු.මිලියන 20.3 ක් වැය කර ඇත. වාහන නඩත්තු සහ ඉන්ධන වියදම් සඳහා මාසික වැය වීම් පහත පරිදි වේ.

**රූප සටහන 5.2 – 2022.09.30 දින දක්වා වාහන නඩත්තු සහ ඉන්ධන පිරිවැය**




- අමාත්‍යාංශයේ "තැපැල" සඳහා පළමු මාස නවය සඳහා රු. මිලියන 2.6ක් වැය වී ඇති අතර, මාසික තැපැල් වියදම පහත ප්‍රස්තාරය මඟින් නිරූපණය වේ

**රූප සටහන 5.3 – 2022.09.30 දින දක්වා අමාත්‍යාංශ තැපැල වෙනුවෙන් දරන ලද වියදම**




- මෙම අමාත්‍යාංශයේ අංශ ප්‍රතිව්‍යුහගත කිරීම මෙම වර්ෂය තුළදී සිදු කරන ලද අතර, ඉදිරියේදී කුලී පදනම මත පවතින අංශ අමාත්‍යාංශය යටතට ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.මෙමගින් රජයට වාර්ෂිකව රු. මිලියන 16ක මුදලක් ඉදිරියේදී ඉතිරිවේයැයි අපේක්ෂා කෙරේ.
- පවතින ආර්ථික තත්ත්වය යටතේ සන්නිවේදන කටයුතු සිදු කිරීම සඳහා ඊමේල්, වට්ස්ඇප් සහ Zoom යෙදවුම් යොදා ගැනීමට කටයුතු කර ඇත.

## මූල්‍ය අංශය

මූල්‍ය අංශය අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතනවල මූල්‍ය කළමනාකරණය හා පාලන කටයුතු සම්බන්ධයෙන් වගකීම දරුලන අතර මෙම අංශය ප්‍රසම්පාදන, මූල්‍ය වාර්තාකරණ, ගෙවීම් හා මානව සම්පත් ගෙවීම් යන ශාඛා 04 කින් සමන්විත වේ.

## 2022 වසරේ සුවිශේෂී කාර්යය සාධනයන්

- රාජ්‍ය සේවා අංශයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා 2022 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 29,429 ක මුදලක් වෙන් කර ඇති අතර, 2022.09.30 දිනට දරන ලද සම්පූර්ණ වියදම රු. මිලියන 20,865.70කි. එය ප්‍රතිශතයක් ලෙස 71%ක් වේ.
- වර්ෂය සඳහා සමස්ත ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 22%ක් ද, පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් 72% ක් ද වියදම් කර ඇත.

රූප සටහන 5.4 – ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සහ 2022.09.30 දිනට තත්‍ය වියදම




රූප සටහන 5.5 – පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සහ 2022.09.30 දිනට තත්‍ය වියදම




- අමාත්‍යාංශය සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සහ අළුත්වැඩියාව කාර්යය යටතේ අවශ්‍යතාවයන්ගෙන් 18%ක ප්‍රමාණයක් නිම කර ඇත.
- භාණ්ඩ සමීක්ෂණය සිදු කර අවසන් කර ඇත.
- රජයේ ගොඩනැගිලි ආදායම් එකතුකිරීමට අදාළව පරිගණක මෘදුකාංගයක් සැකසීමේ කටයුතු සිදු කරමින් පවතී.
- රජයේ ගොඩනැගිලි කුලී ලෙස අය විය යුතුව තිබූ මුදලින් 7%කට වැඩි ප්‍රමාණයක් අය කර ගැනීමට කටයුතු කර ඇත.
- අමාත්‍යාංශයට අයත් නිල නිවාසයන්හි අය විය යුතුව තිබූ හිඟ මුදලින් රු.6,518,988.17ක මුදල් ප්‍රමාණයක් එනම් 8.5%ක් මෙම වර්ෂය තුළ දී අය කර ගැනීමට කටයුතු කර ඇත.

**තොරතුරු තාක්ෂණ අංශය**

මෙම අමාත්‍යාංශය තුළ පරිගණක ජාල පද්ධතිය, ලංකා රාජ්‍ය ජාලය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ දත්ත පද්ධතිය, තොරතුරු තාක්ෂණ දත්ත පද්ධති, පරිගණක දෘඩාංග හා මෘදුකාංග කළමණාකරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රසම්පාදන කටයුතු ඇතුලු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වියදම් යටිතල පහසුකම් පිළිබඳ වගකීම දරණ තොරතුරු තාක්ෂණ ඒකකය, ප්‍රතිසංස්කරණාභිමුඛ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණ ව්‍යාපෘතිවල නියැලී සිටියි.

- **මාර්ගගත ක්‍රමවේදය මගින් පුහුණු වැඩසටහන් හා රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.**

මානව සම්පත් අංශය මගින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා මෙන්ම අනෙකුත් අංශ මගින් පවත්වනු ලබන රැස්වීම් තාක්ෂණික සහයෝගය ලබා දීම සිදු කරන ලදී. එසේම තොරතුරු තාක්ෂණ පුහුණු සඳහා සම්පත්දායකත්වයද ලබා දුනි.

- **අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියේ ආරක්ෂාව සහ අනෙකුත් ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම.**

අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ ආරක්ෂාව තහවුරු කිරීම සහ අනෙකුත් ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා Procons PVT Ltd ආයතනය සමඟ සේවා ගිවිසුමකට එළඹීම සිදු කරන ලද අතර ඔවුන් හරහා වෙබ් අඩවියේ පැවති ආරක්ෂණ දෝෂ නිවැරදි කර ආරක්ෂාව වඩාත් තහවුරු කිරීම සඳහා SSL සහතිකය මිලදී ගෙන වෙබ් අඩවියට ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

- **මෘදුකාංග වැඩි දියුණු කිරීම.**

අමාත්‍යාංශය තුළ භාවිතය සඳහා සංවර්ධනය කරන ලද Internal Awareness system මෘදුකාංගය හා අභ්‍යන්තර තැපැල් බෙදා හැරීම සඳහා සංවර්ධනය කළ තැපැල් මෘදුකාංගය අමාත්‍යාංශයේ අංශ වෙත භාවිතය සඳහා ලබා දෙන ලදී. ඊට අමතරව අමාත්‍යාංශයේ ගොඩනැගිලි කුලී ආදායම ගණනය කිරීම සඳහා සංවර්ධනය කරන ලද Government Building revenue System මෘදුකාංගයේ Quarters මොඩියුලය දත්ත ඇතුළත් කිරීම සඳහා නිවාස හා සංවර්ධන අංශය වෙත ලබා දී ඇත. තවද W&OP මොඩියුලය සංවර්ධනය කර වාර්ෂික දත්ත ඇතුලත් කිරීමෙන් පසුව වාර්ෂික වාර්තාව ලබා ගෙන ගිණුම් අංශය වෙත ලබා දීමට කටයුතු කිරීම.

- **අමාත්‍යාංශයේ ජාලකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම**

නව ජාලකරණ ස්විච සවිකිරීම මගින් අමාත්‍යාංශයේ ජාලකරණ පද්ධතිය කාර්යක්ෂම කිරීමට කටයුතු කිරීම.

- අමාත්‍යාංශ නිලධාරීන්ගේ රාජකාරි හැඳුනුම්පත් 484 සකස් කිරීමේ කටයුතු සිදු කරන ලද අතර, දෛනිකව මතුවන විවිධ තොරතුරු තාක්ෂණ ගැටලු 1500 ක පමණ ප්‍රමාණයක් සඳහා සහය ලබා දීමට කටයුතු කර ඇත.

### අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශයේ හා ඒ යටතේ පවතින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව, භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය, පාර්ලිමේන්තු කටයුතු අංශය, රාජ්‍ය භාෂා අංශය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අදාළව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීමේ වගකීම ද මීට අමතරව අවශ්‍යතාවය අනුව විශේෂ පරීක්ෂණ ද අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථයට අදාළ වේ.

### 2022 වසරේ සුවිශේෂී කාර්යය සාධනයන්

- පළමු, දෙවන හා තෙවන කාර්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇත.



විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

- අමාත්‍යාංශයේ රාජකාරි සිදු කරනු ලබන ක්‍රමවේදයන් නියමිත නීති රෙගුලාසි, කාර්යය පටිපාටිවලට අනුගතව සිදුවන්නේ ද යන්න සොයා බැලීම හා ඒ ඔස්සේ කාර්යයන් මෙහෙයවීම සිදුකරනු ලබන අභ්‍යන්තර විගණන අංශය මඟින් ලබා දෙන ලද දායකත්වයේ ප්‍රතිශතාත්මක ප්‍රගතිය පහත පරිදි වේ.

**වගුව 5.1 - අභ්‍යන්තර විගණන අංශයෙහි කාර්යයන්හි ප්‍රගතිය**

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීම. | 100% |
| මූලික වාර්තා සකස් කිරීම | 100% |
| විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම. | 75% |
| වව්චර් ගෙවීම් | 50% |
| පේ රෝල් පරීක්ෂාව | 100% |
| අත්තිකාරම් ගිණුම | 75 |
| තැන්පතු ගිණුම | 100 |
| හානි සහ write off | 100% |
| ප්‍රාග්ධන වත්කම් සඳහා වූ වියදම් අධීක්ෂණය | 75% |
| ක්‍රියාකාරි සැලැස්ම අධීක්ෂණය | 25% |
| පුද්ගලික ලිපිගොනු විගණනය | 100% |
| වාහන නඩත්තු කාර්යයසාධන විගණනය | 100% |
| විශ්‍රාම වැටුප් දත්ත විශ්ලේෂණය | 25% |

- අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අංශ වෙත 2022.09.30 දින දක්වා අභ්‍යන්තර විගණන විමසුම් 20ක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.
- මෙම වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන අංශය විසින් විශේෂ විගණන පරීක්ෂණ වාර්තා 03ක් සිදු කර ඇත.

**වගුව 5.2 - අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද විශේෂ විගණන පරීක්ෂණ වාර්තා**

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විෂයය (සංක්ෂිප්තව) |
|---|---|
| **රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය** | අමාත්‍යාංශයේ මූල්‍ය අංශයේ කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| **ජාතික භාෂා අංශය** | ජාතික භාෂා අංශයේ කළමනාකරණ සේවා නිලධාරි III ශ්‍රේණියේ නිලධාරිණියක් පිළිබඳ ඉදිරිපත් කල පෙත්සම පිළිබඳ සිදුකළ විගණන පරීක්ෂණය |
| **ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය** | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ සභාපතිතුමා සම්බන්ධව ඉදිරිපත් කල පෙත්සම පිළිබඳ සිදුකළ විගණන පරීක්ෂණය |

# 6. විෂයය ක්ෂේත්‍රය - විශ්‍රාම වැටුප්

### විශ්‍රාම වැටුප් අංශය

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය පරිපාලන ලේකම් වෙත බලතල පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම, විශ්‍රාම වැටුප් සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු සම්පාදනය කිරීම, විශ්‍රාමිකයන්ගේ හා විශ්‍රාමික සංගම්වලින් ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු සම්බන්ධීකරණය කිරීම විශ්‍රාම වැටුප් අංශය මගින් සිදු කෙරේ.

### 2022 වර්ෂයේ සුවිශේෂී කාර්යය සාධනයන්

- විශ්‍රාමිකයින්ගේ "විශ්‍රාම වැටුප් හා සුබසාධනය" සම්බන්ධයෙන් විශ්‍රාමික නිලධාරීන් සහ විශ්‍රාමික සංගම් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු සහිත ලිපි සම්බන්ධව පහත පරිදි කටයුතු කර ඇත.

**වගුව 6.1 - විශ්‍රාමික නිලධාරීන් සහ විශ්‍රාමික සංගම් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු සහිත ලිපි සම්බන්ධ ප්‍රගතිය**

| | ලැබුණු ලිපි සංඛ්‍යාව | ගොනු කරන ලද ලිපි සංඛ්‍යාව | කටයුතු කළ ලිපි සංඛ්‍යාව |
|---|---|---|---|
| ජනවාරි | 351 | 80 | 271 |
| පෙබරවාරි | 305 | 70 | 235 |
| මාර්තු | 324 | 65 | 259 |
| අප්‍රේල් | 178 | 38 | 140 |
| මැයි | 160 | 30 | 130 |
| ජූනි | 168 | 33 | 135 |
| ජූලි | 89 | 25 | 64 |
| අගෝස්තු | 270 | 49 | 221 |
| සැප්තැම්බර් | 455 | 57 | 398 |

- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 හා 15 වගන්ති යටතේ විනය නියෝග මත විශ්‍රාම ගැන්වූ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප හා පාරිතෝෂික ගෙවීම සම්බන්ධ නිර්දේශ ලබා දීම සඳහා ක්‍රියාත්මක වන විනය කමිටුව වෙත නිර්දේශ ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ගොනු සංඛ්‍යාව පහත පරිදි වේ. අදාළ නිර්දේශ ලබා දීමෙන් පසුව ලේකම්තුමන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා එම ගොනු යොමු කෙරේ.

**රූප සටහන 6.1 - විනය කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ගොනු**




- මෙම අංශය විසින් 2022 වර්ෂය තුළදී චක්‍රලේඛ 02ක්, අමාත්‍ය මණ්ඩල සංදේශ 03ක් සහ එක් ගැසට් නිවේදනයක් නිකුත් කර ඇත.

**වගුව 6.2 - විශ්‍රාම වැටුප් අංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ, අමාත්‍ය මණ්ඩල සංදේශ සහ ගැසට් නිවේදන**

| චක්‍රලේඛ / සංදේශ අංකය | කරුණ |
|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2022 | රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2022 | රාජ්‍ය නිලධරයන්ගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා අඩු කිරීම |
| අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය | |
| **PA/Pns-01/02/2022** | විශ්‍රාම ගනු ලබන රජයේ සේවකයින් සඳහා පාරිතෝසික ගෙවීම. |
| **PA/Pns-03/35/2022** | විශ්‍රාම ගනු ලබන රජයේ සේවකයින් සඳහා පාරිතෝසික ගෙවීම. |
| **PA/Pns-04/47/2022** | රාජ්‍ය නිලධරයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා අඩු කිරීම. |
| ගැසට් නිවේදන | |
| - | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රයේ 02 හා 17 වන වගන්තීන් සංශෝධනය කිරීම.<br>රජයේ සේවයේ නියුතු සියලුම රජයේ නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම. |

# 7. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**2022 වසරේ සුවිශේෂී කාර්යය සාධනයන්**

- **රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස සංශෝධනය කිරීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ වෙනත් නීතියක් මගින් හෝ නිශ්චය කර නොමැති නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස හැරුණු කොට සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස 2022.01.01 දින සිට බලාත්මක වන පරිදි අවුරුදු 65 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ නමුත්, නැවත අංක 22/1403/605/014 හා 2022.09.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා පහතට හෙලන ලද අතර එය 2023.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- **"ට" උපලේඛනගත තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබාගැනීම සඳහා වන අවම සේවා කාලය දීර්ඝ කිරීම.**

"ට" උපලේඛනගත තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබාගැනීම සඳහා වන අවම සේවා කාලය අවුරුදු ලෙස සංශෝධනය කිරීමට කටයුතු කර 10 .ඇත

- **ඇඟිලි සලකුණු මගින් වාර්ෂික ජීවිත සහතිකය ලබාදීමේ පහසුකම් තවදුරටත් ව්‍යාප්ත කිරීම.**

2022.01.03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 හා 2022.01.20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2022 අනුව 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් ගණනයට අදාල කර නොගන්නා රු. 5,000ක මාසික දීමනාවක් විශ්‍රාමිකයින් වෙත ලබාදීමට කටයුතු කර ඇත. විශ්‍රාමිකයින් 574,686 දෙනෙකු සඳහා ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා මේ වෙනුවෙන් ගෙවීම් කිරීමට රු.මිලියන 25,959 ක් වැය වී ඇත.ඇඟිලි සලකුණු මගින් වාර්ෂික ජීවිත සහතිකය ලබාදීමේ පහසුකම් තවදුරටත් ව්‍යාප්ත කිරීම.

- **විශ්‍රාමිකයින් සඳහා රු. 5,000ක මාසික දීමනාවක් ගෙවීම.**

2022.02.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2020 (සංශෝධන VII) අනුව ඇඟිලි සලකුණු මාර්ගයෙන් වාර්ෂික ජීවිත සහතිකය ලබාදීමේ පහසුකම් සෙලාන් බැංකු ශාඛා 75ක් ඔස්සේ ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. ඒ අනුව මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පැන් ඒෂියා බැංකු ශාඛා, මහජන බැංකු ශාඛා, ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛා, ප්‍රාදේශීය බැංකු ශාඛා සහ සෙලාන් බැංකු ශාඛා ද ඇතුළුව දිවයින පුරා ස්ථාන 415ක දී විශ්‍රාමිකයන් හට මෙම පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව සලසා ඇත.



**ගරු අමාත්‍යතුමන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක යෙදෙමින්**

- **ත්‍රිවිධ හමුදා විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ ක්‍රමවේදය පහසු කිරීම.**

2022.06.27 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 04/2022 අනුව ත්‍රිවිධ හමුදා සේවා පාරිතෝෂික හා විශේෂ වන්දි ගෙවීමේ අයදුම්පත් කළමනාකරණය සඳහා මාර්ගගත පද්ධතියක් හඳුන්වාදීම.

2022.03.08 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2022 මගින් 1981 යුද්ධ, නාවික හා ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ රෙගුලාසි යටතේ යැපීම් දීමනා හිමි ගැන්වීමේ අයදුම්පත් යොමු කිරීමේදී නව ආකෘති පත්‍රය අනුව අයදුම්පත් ලබාගැනීමට අවශ්‍ය උපදෙස් නිකුත් කර ඇත.

2021.07.22 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2021 මගින් යුධමය වාතාවරණය පැවති කාලවකවානුවේදී මියගිය ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයන්ගේ යැපෙන්නන් වෙත හිමිගැන්වූ ස්ථාවර දීමනාව සංශෝධනය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම.

ත්‍රිවිධ හමුදා මරණ පාරිතෝෂික ගෙවීම් අයදුම්පත් මාර්ගගතව යොමු කිරීමට අවශ්‍ය පහසුකම් සලසාදීම.

- **වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීම.**

2022.10.06 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2016 (සංශෝධන I) මගින් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය සඳහා මින් පෙර පැවති මුද්‍රිත අයදුම්පත් සහ ඇමුණුම් තැපැල මගින් ගෙන්වීමේ ක්‍රමවේදය වෙනස් කරමින් අදාල ලේඛන පරිලෝකනය කර මාර්ගගතව යොමු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇත.

- **විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම.**

2022.09.14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 05/2022 අනුව විශ්‍රාම යාමෙන් පසු විවිධ හේතූන් මත විශ්‍රාම වැටුප් සංශෝධනය කල යුතු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගතව ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

- **විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කළමනාකරණය.**

2022.06.10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2022 අනුව විශ්‍රාම වැටුප් ගෙවීම් කළමනාකරණයේදී හඳුනාගන්නා ලද විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අයකර ගැනීම කළමනාකරණය සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් හඳුන්වා දී ඇත.විදේශගත වන නිලධාරීන්ගේ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් එක්රැස් කිරීම.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022(I), 14/2022(II) සහ 2022.09.19 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2022 අනුව විදේශ රැකියා සහ දේශීය රැකියා සඳහා විශේෂ නිවාඩු ගනු ලබන නිලධාරීන්ගේ නිවාඩු කාලය තුලදී වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් එකරැස් කිරීම සහ ගිණුම්ගත කිරීමට අදාලව නව මාර්ගගත පද්ධතියක් හඳුන්වාදීම.

- **විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීම විමධ්‍යගත කිරීම.**

පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ දිවයිනේ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් මතුවූ ප්‍රවාහන අපහසුතා මත විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වූ විශ්‍රාමිකයින් සඳහා අප්‍රේල් මස සිට අගෝස්තු මාසය දක්වා ගාල්ල, මාතර සහ මහනුවර දිස්ත්‍රික්කවල විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා වන ජංගම සේවා තුනක් පැවැත්වීම.ඔක්තෝබර් 08 දිනට යෙදුනු ජාතික විශ්‍රාමික දිනයට සමගාමීව විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් විමධ්‍යගත කිරීම සිදු කරන ලදී. ඒ අනුව මාතර, අනුරාධපුර, මහනුවර, කුරුණෑගල සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.



**මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැති විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීම විමධ්‍යගත කිරීමේ වැඩසටහන**

- **ජාතික විශ්‍රාමික දිනය සැමරීම**

රටේ පවතින උග්‍ර ආර්ථික අර්බුදය මත ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 හි උපදෙස් පරිදි රාජ්‍ය වියදම් අවම කරමින් මෙම දෙපාර්තමේන්තුව විසින් මෙවර ජාතික විශ්‍රාමික දින සැමරුම ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික පුරවැසි ප්‍රජාවට ලබාදෙන සේවාවන් විමධ්‍යගත කිරීමේ සමාරම්භක වැඩසටහනක් ලෙසින් පවත්වා ඇත.

- **පුහුණු වැඩසටහන් පැවැත්වීම**

විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය හා සම්බන්ධව කටයුතු කරන විවිධ රාජ්‍ය නිලධාරීන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත.

14/2022 චක්‍රලේඛය යටතේ විදේශගත වන නිලධාරීන් සඳහා වැන්දඹු හා අනත්දරු දායක මුදල් එවීම සම්බන්ධ පද්ධතියක් හඳුන්වාදීම සහ මාර්ගගත පුහුණුවක් නිලධාරීන් 5000ක් පමණ පිරිසක් සඳහා වැඩසටහන් 19 ක් ඔස්සේ පුහුණුවීම් සිදු කර ඇත.

දෙපාර්තමේන්තු වෙබ් අඩවිය සහ නිල youtube නාලිකාව හරහා මෙම පුහුණු වැඩසටහන් නැරඹීමේ අවස්ථාව ද සලසා ඇත.

## ♦ විශ්‍රාම වැටුප් ගෙවීම්

**වගුව 7.1 - සක්‍රීය කරන ලද නව විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි- සැප්තැම්බර්)**

| මාසය | විශ්‍රාමිකයන් ගණන | | |
|---|---|---|---|
| | සිවිල් | වැ.වැ.වි.අ. | හමුදා |
| ජනවාරි | 1047 | 709 | 426 |
| පෙබරවාරි | 1562 | 1248 | 898 |
| මාර්තු | 1194 | 756 | 619 |
| අප්‍රේල් | 1658 | 1291 | 690 |
| මැයි | 738 | 509 | 290 |
| ජුනි | 531 | 983 | 248 |
| ජුලි | 1260 | 757 | 759 |
| අගෝස්තු | 520 | 583 | 833 |
| සැප්තැම්බර් | 1347 | 1027 | 921 |

**රූප සටහන 7.1 - සක්‍රීය කරන ලද නව විශ්‍රාමිකයින් සඳහා ගෙවන ලද මුදල (රු.මිලියන)**




**වගුව 7.2 - පාරිතෝෂික ගෙවීම් (ජනවාරි- සැප්තැම්බර්)**

| මාසය | විශ්‍රාමිකයින් සංඛ්‍යාව | මුදල රු. මිලියන |
|---|---|---|
| ජනවාරි | 1,143 | 1,200.79 |
| පෙබරවාරි | 423 | 383.03 |
| මාර්තු | 1,679 | 1,674.23 |
| අප්‍රේල් | 1,353 | 1,090.41 |
| මැයි | 1,395 | 1,405.95 |
| ජුනි | 1,456 | 1,524.49 |
| ජුලි | 1,165 | 1,105.41 |
| අගෝස්තු | 2,958 | 2,950.35 |
| සැප්තැම්බර් | 3,038 | 2,625.81 |
| එකතුව | **14,610** | **13,960.48** |

**රූප සටහන 7.2 - 2022 වසරේ විශ්‍රාම ලැබූ සංඛ්‍යාව (ජනවාරි- සැප්තැම්බර්)**




**වගුව 7.3 - විශ්‍රාම වැටුප් විෂමතා සහ සංශෝධන (ජනවාරි- සැප්තැම්බර්)**

| මාසය | සංඛ්‍යාව | මුදල රු. මිලියන |
|---|---|---|
| ජනවාරි | 814 | 73.00 |
| පෙබරවාරි | 980 | 69.43 |
| මාර්තු | 1,092 | 29.71 |
| අප්‍රේල් | 1525 | 44.47 |
| මැයි | 1274 | 66.91 |
| ජුනි | 1318 | 85.48 |
| ජුලි | 1238 | 73.34 |
| අගෝස්තු | 819 | 95.24 |
| සැප්තැම්බර් | 861 | 77.80 |
| එකතුව | **9,921** | **615.37** |

**වගුව 7.4 - දායක මුදල් ආපසු ගෙවීම් (ජනවාරි- සැප්තැම්බර්)**

| මාසය | ගෙවූ සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 82 |
| පෙබරවාරි | 184 |
| මාර්තු | 453 |
| අප්‍රේල් | 113 |
| මැයි | 40 |
| ජුනි | 214 |
| ජුලි | 252 |
| අගෝස්තු | 263 |
| සැප්තැම්බර් | 233 |
| එකතුව | **1,834** |

**රූප සටහන 7.3 - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් සහ ගෙවීම් (ජනවාරි- සැප්තැම්බර්)**




**වගුව 7.5 - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අලුතින් එක්වූ සහ ඉවත් වූ සාමාජික සංඛ්‍යාව (ජනවාරි- සැප්තැම්බර්)**

| මාසය | අලුතින් එක් වූ සාමාජික සංඛ්‍යාව | ඉවත් වූ සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 4,151 | 447 |
| පෙබරවාරි | 4,260 | 431 |
| මාර්තු | 3,749 | 505 |
| අප්‍රේල් | 1,689 | 432 |
| මැයි | 1,691 | 294 |
| ජූනි | 853 | 287 |
| ජූලි | 88 | 287 |
| අගෝස්තු | 4,090 | 329 |
| සැප්තැම්බර් | 2,925 | 527 |
| එකතුව | **23,496** | **3,539** |

**වගුව 7.6 - ප්‍රාග්ධන හා පුනාවර්තන වියදම් (රු.මි)**

| මාසය | පුනරාවර්තන වියදම් (රුමි) | ප්‍රාග්ධන වියදම් (රු.මි) |
|---|---|---|
| ජනවාරි | 24,882.67 | 0.19 |
| පෙබරවාරි | 30,580.46 | 1.05 |
| මාර්තු | 28,978.18 | 4.39 |
| අප්‍රේල් | 28,945.32 | - |
| මැයි | 28,434.62 | 0.08 |
| ජූනි | 28,767.00 | 0.82 |
| ජූලි | 28,598.95 | 0.37 |
| අගෝස්තු | 30,098.65 | 0.56 |
| සැප්තැම්බර් | 30,249.08 | 2.86 |
| එකතුව | **259,534.93** | **10.33** |

**වගුව 7.7 - ආදායම් එකතුකිරීම්**

| විස්තරය | එකතු කරන ලද ආදායම (රු.මි) |
|---|---|
| මධ්‍යම රජය | 18,002.52 |
| පළාත් සභා | 9,856.85 |
| ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | 337.32 |
| **එකතුව** | **28,196.68** |

- දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි කුලී පදනම මත ලබාදීම මගින් ජනවාරි මස සිට සැප්තැම්බර් මාසය දක්වා රු.මිලියන10.6ක මුදලක් සහ නිවාඩු නිකේතන මගින් රු.මිලියන 1.27ක මුදලක් රජයේ ආදායම් වශයෙන් උපයාදී ඇත.

## 2022 වසර තුළ ඉදිරියේදී ඉටු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- 2022 ඔක්තෝබර් 01 දින වන විට පොරොත්තු ලේඛනයේ සිටින විශ්‍රාමිකයින් 14,883 දෙනෙකු සඳහා පාරිතෝෂික ගෙවීම් කළ යුතු වන අතර ඒ සඳහා රු. මිලියන 15,414ක අක්මුදල් මහ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුව ඇත. ඒ අනුව පාරිතෝෂික ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් විශ්‍රාමිකයින්ට සිදුවන අපහසුතාවය අවම කිරීම සඳහා නව විධි විධාන ඇතුළත් කරමින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට සංශෝධන යෝජනා කිරීම.
- රජයේ සේවයේ යෙදී සිටියදී මියගිය නිලධාරීන් සඳහා වන මරණ පාරිතෝෂික ප්‍රතිලාභ හිමිකරදීම් දත්ත පද්ධතිය හරහා පමණක් සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- 2016.01.01 ට පෙර විශ්‍රාම ගිය සිවිල් විශ්‍රාමිකයින් සඳහා අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණාවරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- 2015න් පසු පත්වීම් ලද රාජ්‍ය නිලධාරීන් සඳහා හිමිවන විශ්‍රාම වැටුප් ක්‍රමය නිශ්චිතව හඳුන්වාදීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/94ට පරිභාහිරව රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව වන අවු.45 ඉක්මවා මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්ට බඳවා ගැනීම් ස්ථිරවම නතර කිරීම සහ දැනට බඳවා ගෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ඉල්ලුම්

කරන සේවකයින් සම්බන්ධයෙන් පොදු තීරණයක් ගැනීම.

- පවතින මූල්‍ය අර්බුදය හමුවේ හා ඉදිරියේදී තිරසාර විශ්‍රාම වැටුප් ගෙවීමක් සඳහා රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවය සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හා අරමුදලක් හඳුන්වාදීම.
- මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රම ඒකාබද්ධ කර එක් ආයතනයකින් මෙහෙයවීම.
- දැනටමත් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ නොලබන පෞද්ගලික සහ ස්වයං රැකියා සහ අනෙකුත් ක්ෂේත්‍රයන් සඳහා සැමට විශ්‍රාම ජාතික ප්‍රතිපත්තිය යටතේ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම

# 8. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය යනු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ දැනුම වර්ධනය කිරීම හා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය අංශයේ පුහුණු සංවිධානයයි. කළමනාකරණ පුහුණු කටයුතු වලට අමතරව කළමනාකරණයේ හඳුනාගත් ක්‍රියාකාරී අංශ සංවර්ධනය කිරීම සඳහා මෙන්ම ආයතනික පද්ධති සමාලෝචනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් කළමනාකරණ උපදේශන සේවා හා පර්යේෂණ සිදු කරනු ලබයි.

### 2022 වර්ෂයයේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හි විශේෂ සිදුවීම්

- **රාජ්‍ය කළමනාකරණ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MPM) 2021/2023 වර්ෂය සඳහා නවකයින් බඳවා ගැනීම**

2021/2023 රාජ්‍ය කළමනාකරණ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සමාරම්භක උත්සවය ස්ලිඩා හි සංකථනී ශාලාවේදී 2022.09.16 දින පැවැත්විණි.

- **2021 ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට බඳවා ගත් නවක නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණුව අවසානයේ සහතික පත් පිරිනැමීම**

2021 ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට බඳවා ගත් නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණුව අවසන් කර සහතික පත් පිරිනැමීම 2022.09.30 වන දින ස්ලිඩා ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වුණි.



ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට බඳවා ගත් නවක නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණුව

- **ඉංග්‍රීසි පාඨමාලා සඳහා 2021 වර්ෂයට නවකයින් බඳවා ගැනීම**

ස්ලිඩා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා නිලධරයන් 38 දෙනෙකුත්, රැකියා අරමුණු සඳහා ඉංග්‍රීසි භාෂා ස්ලිඩා සහතික පත්‍ර පාඨමාලාව සඳහා නිලධරයන් 44 දෙනෙකුත් බඳවා ගන්නා ලදී.

- **2022 වර්ෂයේදී පවත්වන ලද විභාග**

2022 වර්ෂය සඳහා රාජ්‍ය සේවයට නිලධාරීන් බඳවා ගැනීම සඳහා පවත්වන ලද විවෘත තරඟ විභාග 02ක්, කාර්යක්ෂමතා කඩඉම් විභාග 23ක් සඳහා අයදුම්කරුවන් 1,135 ක් සහභාගිවන ලදී . ඊට අමතරව ස්ලිඩා ආයතනය විසින් පවත්වන ලද පාඨමාලාවලට අදාළ විභාග 16 ක් සහ අභ්‍යන්තර විභාග 3 ක් ද සිදු කරන ලද අතර ඒ සඳහා අයදුම්කරුවන් 532ක් සහභාගී විය.

- **තොරතුරු තාක්ෂණ හා වැඩසටහන් ප්‍රවර්ධන අංශය**

– ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2021 (විවෘත) කණ්ඩායම සඳහා මධ්‍යස්ථාන තුනකදී මාර්ගගත ක්‍රමයට සේවාරම්භක පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

– SLIDA Computer Driving License වැඩසටහනේ විභාග අපේක්ෂකයන් 33 දෙනෙකු සඳහා විභාග පවත්වා ඇත.

- **පර්යේශණ අංශය**

– කළමනා සඟරාවේ අටවන වෙළුමේ පළමු කලාපය වන 2021 ජූලි- දෙසැම්බර් කලාපය නිකුත් කිරීමට කටයුතු කර ඇත.

– Newsletters සඟරාවේ හත්වන වෙළුමේ පළමු කලාපය හා දෙවන කලාපය නිකුත් කර ඇත

# 9. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

## 2022 වසර තුළ ළඟා කරගත් ඉලක්ක

- **අධ්‍යාපන අමාත්‍යාංශය උදෙසා වන ධාරිතා සංවර්ධන වැඩසටහන්**

බස්නාහිර පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ස්වකීය දෙපාර්තමේන්තුවට සහ බස්නාහිර පලාතේ කලාප අධ්‍යාපන කාර්යාලයන්ට අනුයුක්ත කරන ලද කළමණාකාර සහකාරවරුන් සහ සංවර්ධන නිලධාරීන් උදෙසා විවිධ විෂය කලාපයන් යටතේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේ කාර්යය දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට පවරන ලදී. ඒ අනුව 2022 වසර තුළ මිශ්‍ර මාදිළියෙන් යුතුව කරගෙන යනු ලබනා වැඩසටහන් 11 ක් මගින් නිලධාරීන් 120 දෙනෙකු පුහුණු කරන ලදී.

- **මාර්ගගත ක්‍රමයට විභාග පැවැත්වීම**

විවිධාකාර සේවාලාභීන් උදෙසා මාර්ගගත විභාග පැවැත්වීම අතින් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ඉදිරියෙන්ම සිටී. එසේ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය මගින් සේවය සලසනු ලබනා සේවාලාභීන් අතර වරලත් කළමණාකරන ගණකාධිකාරී (CIMA),වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමය (ACCA) සහ වරලත් මූල්‍ය විශ්ලේෂක (CFA) යන ආයතන වේ. ස්වකීය විශ්වාසී විභාග පරිසරය හේතුවෙන් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය යනු සේවාලාභීන් විසින් සිය විභාග පැවැත්වීම උදෙසා සේවය අපේක්ෂා කරනා ආයතනයක් බවට පත්ව තිබේ.



මාර්ගගත විභාග පැවැත්වීම

- **ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ පැවැත්වීම**

තොරතුරු තාක්ෂණය මත පදනම්ව වැඩබිම් හී ඵලදායකත්වය වර්ධනය කිරීම, උසස් එක්සෙල් භාවිතය, රජයේ ප්‍රසම්පාදනයන් හිදී ලංසු ඇගයීම, සහ රජයේ ප්‍රසම්පාදනයන්හී ලංසු කටයුතු සාර්ථක අයුරින් සිදුකිරීම වැනි මාතෘකා සම්බන්ධයෙන් වන සම්මන්ත්‍රණ ඇතුළුව ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ 20ක් පවත්වන්නට 2022 වසර තුළදී දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට හැකිව තිබේ. මෙකී සම්මන්ත්‍රණ මාර්ගගත ක්‍රමයට මෙන්ම ඉන් බැහැරව සාමාන්‍ය ආකාරයටද පවත්වන ලදී.



රජයේ ප්‍රසම්පාදනයන් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

- **පද්ධති සහ ජාල පරිපාලනය**

ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ යටතේ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් පවත්වන ලද ප්‍රමුඛ වැඩසටහන් අතර අත්‍යවශ්‍ය පද්ධති සහ ජාල පරිපාලනය යන පුහුණු වැඩසටහන්ද වේ.

- **රජයේ ප්‍රසම්පාදනයන් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

40කට අධික නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රජයේ ප්‍රසම්පාදනයන් පිළිබඳ දින 10ක සහතිකපත්‍ර වැඩ සටහනක් පවත්වන ලදී. මේ වැඩ සටහන පවත්වන ලද්දේ මාර්ගගත ක්‍රමයටය.

- **ෆ්ලටර් රාමුව භාවිතයෙන් මොබයිල් ඇප් සංවර්ධනය කිරීම**

මොබයිල් ඇප් සංවර්ධනය උදෙසා වන පුහුණු වැඩසටහනක් යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් මාර්ගගතව පවත්වන ලදී. එහි සහතික පත් පිරිනැමීමේ උත්සවය යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්විණි

- **අදාල පරිශ්‍රයෙහි පුහුණුව**

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය සේවාලාභී අවශ්‍යතා අනුව සපයනු ලබන පුහුණු වැඩසටහන් සේවාලාභීන්ගේ පරිශ්‍රයන්හිම පවත්වයි. මෙහිදී මාතෘකා කිහිපයක් යටතේම බොහෝ වැඩ සටහන් සංවිධානය කරනු ලබයි.

# 10. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

රජයට මානව සම්පත් සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශකත්වය ලබා දීමට සුදුසු ආයතනික රාමුවක් බිහිකිරීමයි. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාවලි සැලසුම, ප්‍රතිපත්ති සමාලෝචනය හා මානව සම්පත් සංවර්ධනය කිරීමත් යනාදී අංශ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව වගකීම් දරයි.

**2022 වසර තුළදී අත්පත් කරගෙන ඇති ජයග්‍රහණ**

- කොළඹ දිස්ත්‍රික්කයේ සේවයේ නියුතු රාජ්‍ය සේවයට බඳවාගත් උපාධිධාරීන් සඵලදායිව සේවයේ යොදවා ගැනීම පිළිබඳ අධ්‍යනය සිදුකොට එහි වාර්තාව ප්‍රකාශයට පත්කොට ඇත




- සංඛ්‍යාන අත්පොත - 2021 පිළියෙළ කොට සභාවේ වෙබ් අඩවියේ පළකොට ඇත
- මානව ප්‍රාග්ධන සහරාව පිළියෙළ කොට සභාවේ වෙබ් අඩවියේ පළකොට ඇත
- මානව සම්පත් සංවර්ධනය පිළිබඳ විශේෂඥ සංචිතයක් පිහිටුවා ඇත.
- රැකියා අරුණ වැඩසටහන මීගමුව නගර ශාලාවේ පැවැත්වූ අතර ඒ සඳහා පාසැල් හැරගිය සහ වෘත්තීය පුහුණුව ලැබූවන් සියයකට අධික පිරිසක් සහභාගී විය.



**මීගමුව නගර ශාලාවේ පවත්වන ලද රැකියා අරුණ වැඩසටහන**

**2022 වසර තුළදී අත්පත්කර ගැනීමට නියමිත ඉලක්කයන්**

- ජාතික මානව සම්පත් හා රැකිරක්ෂා ප්‍රතිපත්තිය වත්මන් රජයේ "සෞභාග්‍යයේ දැක්ම" අනුව සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම
- උප ජාතික මට්ටම් වල මානව සම්පත් සංවර්ධනය මැන බැලීම සඳහා මානව සම්පත් සංවර්ධන දර්ශක සංවර්ධනය කිරීමේ හැකියාව සහ අවශ්‍යතාවය සොයා බැලීම
- 2022 වර්ෂය සඳහා සංඛ්‍යාන අත්පොත පිළියෙළ කිරීම

**ආයතනයේ කාර්යයන් ඵලදායිව කර ගැනීම සඳහා යොදාගන්නා ලද ක්‍රියාමාර්ග**

- නිවසේ සිට වැඩ කිරීමේ සංකල්පය අනුව මාර්ගගත ක්‍රමයට කාර්යාලීය එදිනෙදා වැඩ ඉටු කරවා ගත් අතර, Zoom තාක්ෂණය ඔස්සේ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ Zoom" තාක්ෂණය ඔස්සේ විවිධ පාර්ශවකරුවන් සමග රැස්වීම්, සාකච්ඡා පවත්වන ලදී.
- ඊමේල් මගින් ලිපිගනුදෙනු කිරීම මගින් කඩදාසි භාවිතය හැකිතාක් දුරට අවම කිරීමට කටයුතු කර ඇත.

# 11. ජාතික භාෂා අංශය

ප්‍රජාවන් අතර සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා අමාත්‍යාංශයේ අංශයක් ලෙස ජාතික භාෂා අංශය ක්‍රියාත්මක වේතිපත්තිය සඵලදායී භාෂා ප්‍රරාජ්‍ය . යාත්මක කිරීම උදෙසා හඳුනාගන්නා ලද ලෙස ක්‍රි වැඩසටහන් විවිධ මට්ටම් හරහා විවිධ යාන්ත්‍රණයන් මගින් පවත්වනු ලැබේ .

**රාජ්‍ය භාෂා සංවර්ධන වැඩසටහන 2022-යටතේ අත්කරගත් ජයග්‍රහණ**

- **පාසල් සහ සහජන පුස්තකාල සඳහා ත්‍රෛයි භාෂික පොත් බෙදාහැරීම .**

ත්‍රෛයි භාෂික පුස්තකාල පොත් 59ක් දිස්ත්‍රික්ක 6 ක පාසල් සහ මහජන පුස්තකාල අතර බෙදා හරින ලදී.



පාසල් සහ සහජන පුස්තකාල සඳහා ත්‍රෛයි භාෂික පොත් බෙදාහැරීම

- **කිලිනොච්චි සහ මඩකලපු භාෂා මධ්‍යස්ථාන**

රාජ්‍ය නිලධාරීන් උදෙසා දෙවන භාෂා භාවිතය පිළිබඳ දැනුම දියුණු කිරීම පිණිස පාඨමාලා පැවැත්වීමට තිලිනොච්චි භාෂා මධ්‍යස්ථානයේ පහසුකම් සලසනු ලබයි.තවද ආයතන මට්ටමින් දෙවන භාෂා භාවිතය වැඩි දියුණු කිරීම පිණිස පද්ධති සහ පරිපාටි සංවර්ධනයට පාඨමාලා පැවැත්වේ.

**විශේෂ අවස්ථා සහ ජයග්‍රහණ**

රටෙහි පැවති අස්ථාවරත්වය හේතුකොටගෙන, වසරේ මුල් මාස හය තුළ අයවැය මගින් ප්‍රතිපාදන සපයන ලද කාර්යයන් විධිමත් ලෙස ඉටු කිරීමට නොහැකි විණි. එහෙයින් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සංශෝධනය කරන ලද අතර එහි ප්‍රගතිය පහත දැක්වේ.

**වගුව 11.1 - ජාතික භාෂා අංශයෙහි ප්‍රතිපාදන සපයන ලද කාර්යයන්හි ප්‍රගතිය**

| අනු අංකය | ප්‍රධාන ක්‍රියාකාරකම් | සංශෝධිත ප්‍රතිපාදන රු මි) | වියදම | සටහන් |
|---|---|---|---|---|
| අ | ජාතික භාෂා සංවර්ධන වැඩසටහන (2509) | 5.0039 | - | අතැති බිල්පත් රු මි 4.8489 |
| B | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම (1703 ) | 0.455 | රු0.1183 | අතැති බිල්පත් රු.මි 0.3367 |
| | එකතුව | **5.4589** | | |

# 12. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. කොමිෂන් සභාව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් සයදෙනෙකුගෙන් සමන්විත වන්නේය.

## 2022 වසරේ සුවිශේෂී කාර්යයසාධනය

- **භාෂා විගණන කටයුතු සිදුකිරීම**

රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධාන රාජ්‍ය යාන්ත්‍රණය මගින් නිසි පරිදි අනුගමනය කරන්නේද යන්න පරික්ෂාවට ලක්කිරීම සඳහා භාෂා විගණන 21ක් මෙම වර්ෂය තුළදී සිදු කරනු ලදී.



**භාෂා විගණනය- ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, හම්බන්තොට**

- **දැනුවත් කිරීම් වැඩසටහන්**

රාජ්‍ය නිලධාරීන්, මහජනතාව සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කළ හැකි විවිධ පාර්ශවයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 07ක් ක්‍රියාත්මක කරන ලදී.

- රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය 2022.01.12 දින එළිදක්වන ලදී.
- භාෂාව සඳහා තාක්ෂණය යොදාගැනීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ගිහාන් ඩයස් සමග මූලික සාකච්ඡාවක් 2022.06.16 දින පවත්වා ඇත.
- 2022 වර්ෂය තුළ මහජන පැමිණිලි 40ක් කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, ඉන් පැමිණිලි 11 ක් විමර්ශනය කර ඇත.
- රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මගින් භාෂා විගණන, රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීම සහ සමීක්ෂණ සිදුකිරීම අදාළ ආයතන වෙත ගොස් භෞතිකව පැවති ප්‍රායෝගික අපහසුතා හේතුවෙන් මාර්ගගත ක්‍රමය යටතේ ඉහත ක්‍රියාකාරකම් සිදුකිරීමට කොමිෂන් සභාව පියවර ගෙන ඇත.

## 2022 වර්ෂය තුළදී ඉටුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- දෙමළ භාෂා දිනය වෙනුවෙන් බස්නාහිර පළාතේ දෙමළ මාධ්‍ය පාසල් ළමුන් සඳහා පාසල් භාෂා කව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සහ එහි නෛතික පසුබිම පිළිබඳව දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මාණ්ඩලික නිලධාරින් දැනුවත් කිරීම.
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සහ එහි නෛතික පසුබිම පිළිබඳව උතුරු පළාතේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරින් දැනුවත් කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු සමීක්ෂණයට භාජනය කිරීම.
- භාෂා නීතිය බලාත්මක කිරීම සඳහා උපයෝගී කරගතහැකි මාර්ගෝපදේශ අත්පොතක් නිර්මාණය කිරීම. මෙම අත්පොත මගින් කොමිෂන් සභාවේ බලාත්මක කිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම කිරීමට අපේක්ෂා කරයි.

ඉහත අපේක්ෂිත කර්තව්‍යයන් ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් භෞතිකව පැවැත්වීමට නොහැකි වුවහොත් මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට කටයුතු කරනු ඇත.

# 13. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

**වර්ෂය තුළදී අත්පත් කර ගන්නා ලද සුවිශේෂී ජයග්‍රහණ**

- 2022.09.30 දිනට රාජ්‍ය නිලධාරීන් 9,228 දෙනෙකු සඳහා රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණ පවත්වා ඇත.
- **"දෙපාර්තමේන්තු ඉතිහාසය"** කෘතිය 2022.10.01 දිනට යෙදුනු සංවත්සර දිනයේදී එළිදක්වන ලදී.



**දෙපාර්තමේන්තු ඉතිහාසය කෘතිය දොරට වැඩීම**

- සාහිත්‍ය කෘති විශාල සංඛ්‍යාවක් සිංහල භාෂාවට පරිවර්තනය කරමින් කරන ලද සේවය ඇගයීම පිණිස රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ **සුවිශේෂී උපහාර සම්මානය**, ප්‍රවීණ පරිවර්තක, ලේඛක, දේශක සාහිත්‍යවේදී වුලානන්ද සමරනායක මහතා වෙත පිරිනමන ලදී.



**රාජ්‍ය භාෂා සුවිශේෂී උපහාර සම්මානය, සාහිත්‍යවේදී වුලානන්ද සමරනායක මහතා වෙත පිරිනැමීම**

- 2022.10.31 දිනට යෙදුනු භාෂා පරිවර්තන දිනය සැමරීම නිමිත්තෙන් පරිවර්තක නිලධාරීන් සඳහා භාෂා පරිවර්තන අත්පොත එළිදක්වන ලද අතර මේ වන විට පදමාලා 75ක් පරිශීලනය කළ හැක.
- නව පාරිභාෂික පදමාලා 08ක් Termino Hub වෙබ් පිටුව හරහා අන්තර්ජාලයට මුදා හරින ලදී.
- රාජ්‍ය නිලධාරීන් සඳහා පවත්වනු ලබන භාෂා පුහුණු පාඨමාලා 381ක් අවසන් කළ නිලධාරීන් 21,889ක් සඳහා සහතිකපත් ප්‍රදානය කර ඇත.
- සිංහල භාෂා දිනය සැමරීම ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ මහතාගේ ප්‍රධාත්වයෙන් වලපනේ අධ්‍යාපන කලාපයේ පාසල් 24ක සිසුන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- මතභේදයට ලක් වී ඇති භාෂා ගැටලු විසඳීම සඳහා ප්‍රවීණ කුසලතාවයෙන් යුත් සිංහල දෙමළ මාධ්‍යයෙන් විද්වත් මණ්ඩලයක් තෝරා පත්කර ගැනීම.
- පවතින ආර්ථික තත්ත්වය යටතේ සුදුසුකම්ලත් භාෂා උපදේශකවරුන් බඳවාගැනීම් කටයුතු සඳහා වන සම්මුඛ පරීක්ෂණ හා පුහුණු සූම් ඔස්සේ පැවැත්වීම, පරිවර්තන කටයුතු මාර්ගගතව සිදු කිරීම සහ පාඨමාලා සහතික පත්‍ර නිරීක්ෂණය සඳහා Certificate Verification System හඳුන්වා දීම.

**වර්ෂය තුළ සිදු කිරීමට නියමිත විශේෂිත ක්‍රියාකාරකම්**

- Bhashawa.lk වෙබ් අඩවිය හරහා භාෂා පහසුකම් සලසන්නන්ගේ සංචිතය යාවත්කාලීන කිරීම සඳහා බඳවා ගැනීමේ පරීක්ෂණය පැවැත්වීම.
- රා.ප.චක්‍රලේඛය 1/2014 ප්‍රකාරව මේ වන විට අයදුම්පත් ඉදිරිපත් කර ඇති වාචික පරීක්ෂණ අවසන් අවස්ථා හිමිකර ගැනීමට ඉල්ලුම්කර ඇති රාජ්‍ය නිලධාරීන් 10,772 දෙනෙකු සඳහා භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණ පැවැත්වීම.
- අපේක්ෂකයන් 120ක් සඳහා ජාතික භාෂා සුදුසුකම් (NLQ) ඇගයීම් පරීක්ෂණ පැවැත්වීම.
- රා.ප.චක්‍රලේඛ 18/2020 ප්‍රකාරව රාජ්‍ය නිලධාරීන් සඳහා දීප ව්‍යාප්තව පාඨමාලා සංවිධානය කිරීම.
- දෙමළ ශීර්ෂ සහිත අකාරාදිය සහ සිංහල ශීර්ෂ සහිත අකාරාදිය නිර්මාණයකර e-book හරහා අන්තර්ජාලයට මුදා හැරීමට නියමිතය.

# 14. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

වඩා යහපත් යාන්ත්‍රණයක් උදෙසා ජාතීන් අතර සංහිඳියාව වර්ධනය කරමින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය, 2007 අංක 26 දරණ පනතින් පිහිටුවන ලදි.

**2022 වසර තුළ අත්පත් කරගන්වනා ලද සුවිශේෂී ජයග්‍රහණ පිළිබඳ තොරතුරු**

- **ප්‍රාග්ධන ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය**

2022 වර්ෂය සඳහා, පුහුණු පාඨමාලා 1300 ක් සඳහා, රු .මි .20 ක් පමණක් වෙන් කර ඇති පසුබිමක මෙම වෙන්කරන ලද ප්‍රතිපාදන වලට අදාලව වාර්ෂික ඉලක්කය, මේ වනවිටත් 100%කින් ලඟා කර ගෙන ඇත.

**වගුව 14.1 - ප්‍රාග්ධන ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය**

| අ අං/ක | වැඩසටහන | ඉලක්කය | | | 2022202 -01.01 .20.9.30 දක්වා ප්‍රගතිය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැඩසටහන් ගණන | පාඨමාලා ලාභීන් ගණන | ප්‍රතිපාදන .රු) (.මිලි | භෞතික ප්‍රගතිය අවසන් කරන ) යාත්මක වෙමින් පවතිනලද සහ ක්‍රි වැඩසටහන්( | | | මූල්‍ය ප්‍රගතිය | |
| | | | | | වැඩසටහන් ගණන | පාඨමාලා ලාභීන් ගණන | % | .රු) (.මිලි | % |
| 1 | රාජ්‍ය නිලධාරීන් සඳහා වන පැය 100 දෙමළ භාෂා පුහුණු /සිංහල වැඩසටහන් | 6 | 300 | .588 | 3 | 161 | | | |
| 2 | රාජ්‍ය නිලධාරීන් සඳහා වන පැය 150 දෙමළ භාෂා පුහුණු /සිංහල වැඩසටහන් | 90 | 4,500 | 12.6 | 87 | 5,019 | 100 | 8.898 *** | 55% *** |
| 3 | රාජ්‍ය නිලධාරීන් සඳහා වන පැය 200 දෙමළ භාෂා පුහුණු /සිංහල වැඩසටහන් | 15 | 750 | 2.97 | 21 | 1,241 | | | |
| | **එකතුව** | **111** | **5,550** | **16.158** | **111** | **6,421** | | | |
| 4 | සම්පත්දායකයින් සඳහා වන පසුවිපරම් සහ නියාමන වැඩසටහන් | 6 | 360 | 0.72 | 8 | 521 | 133 | .613 | 85.2 |
| | **මුළු එකතුව** | **117** | **5,910** | **16.878** | **119** | **6,941** | | | |

***** ලබා දෙන ලද මුදල් ප්‍රතිපාදන වලින් ගෙවීම් සිදු කර ඇත. පාඨමාලා වලට අදාලව ගෙවිය යුතු වවුචර් පත් තවදුරටත් ලැබෙමින් පවතී.**

- **2022.09.30 දිනට අවසන් කර ඇති සහ ක්‍රියාත්මක වෙමින් පවතින ආදායම් උත්පාදිත පාඨමාලා**

සිංහල, දමළ, හිංදි, ජපන්, ප්‍රංශ, භාෂා පරිවර්තන, බ්‍රේල් භාෂා හා සංඥා භාෂා ආදී ආදායම් උත්පාදිත පාඨමාලා මඟින් රුපියල් මිලියන 64.24ක මුදලක් උත්පාදනය කිරීමට හැකි වූ අතර, Zoom තාක්ෂණය මේ සඳහා යොදාගෙන ඇත.

- "සමාජ මෙහෙවරක් උදෙසා නව වෘත්තීය මාවතක්, සංඥා බස උගෙන සෞභාග්‍යයට අත දෙමු" මැයෙන් ජාත්‍යන්තර භාෂා දිනය නිමිත්තෙන් සංඥා භාෂා සහතික පත්‍ර පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු කිරීම. එක් කාණ්ඩායමකට පාඨමාලාලාභීන් 17 දෙනෙකු බැගින් පාඨමාලාලාභීන් 34 දෙනෙකු සඳහා 2022.01.02 දින මෙම පාඨමාලාව ආරම්භ කිරීම.




**ජාත්‍යන්තර භාෂා දිනය නිමිත්තෙන් පළවූ ප්‍රචාරණ දැන්වීම හා සංඥා භාෂා සහතික පත්‍ර පාඨමාලාවේ විෂය නිර්දේශය**

- **ගණඳුර මැදින් ආලෝකය දකිමු" එන්න, අපි ඔවුන්ට (ආ)ලෝකය පෙන්වමු. මැයෙන්, අනුකලන භාෂා අධ්‍යාපන ප්‍රවර්ධනයේ පියවරක් ලෙස, බ්‍රේල් භාෂා සහතිකපත්‍ර පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු කිරීම.**
- පාඨමාලාලාභීන් 14 සඳහා ප්‍රංශ භාෂා සහතිකපත් පාඨමාලාව 2022.09.30 දින ආරම්භ කිරීම.
- දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය මාතලේ දිස්ත්‍රික් නාගරික සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම.

**සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව ඉටුකරමින් පවතින හෝ ඉටු කිරීමට නියමිත නව ක්‍රියාකාරකම් හා වර්තමාන ප්‍රගතිය**

- **ගුරු පුහුණු පාඨමාලා -** මෙම පාඨමාලව මඟින් භාෂා හැකියාව සහ ඉගැන්වීමේ හැකියාව ඇති පුද්ගලයින්ට මෙම ආයතනයේ සම්පත්දායකයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව ලැබෙන අතර ඒ මඟින් ඔවුන්ට ආදායම් මාර්ග උදා වී ඇත. 2022 වර්ෂය තුල මෙවැනි පාඨමාලා 2ක් පවත්වා ඇති අතර ඉන් සම්පත් දායකයින් 89 දෙනෙකු පුහුණු කර ඇත එසේම ඉදිරි මාස .3 තුල ගුරු පුහුණු පාඨමලා ක්‍රියාත්මක කිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇත.
- විදේශ ගත වන ශ්‍රමියින් සඳහා විදේශ භාෂා පුහුණු පාඨමාලා - මෙම පුහුණුව තුලින් ඔවුනට වඩාත් කාර්යක්ෂම සේවයක් සැලසීමට හැකියාව ලැබෙන අතර අප රටේ කීර්තිනාමය ඉහලට ඔසවා තැබීමට ඉවහල් වේ.
- සංචාරක මඟ පෙන්වන්නන් සඳහා විදේශ භාෂා පුහුණු පාඨමාලා - මෙම පුහුණුව තුලින් ගුණාත්මක සේවයක් සැලසීමට අවස්තාව උදාවන අතර රටේ කීර්තිනාමය වැඩි වීමට ඉවහල් වේ.
- ආයතනය මඟින් ක්‍රියත්මක කරනු ලබන අනෙකුත් සියලුම භාෂා පුහුණු පාඨමාලා මඟින් ඵලදායි සහ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබා දීමට පිටිවහලක් වෙතයි අපේක්ෂා කෙරේ.

## 15. පාර්ලිමේන්තු කටයුතු අංශය

**2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සුවිශේෂී වැඩසටහන්**

- ගරු මන්ත්‍රීවරුන්ගේ පර්යේෂණ නිලධාරින් සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් 05ක් පවත්වා ඇත.
- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩලය සඳහා "පර්යේෂණ ක්‍රමවේදය" පිලිබඳ මාර්ගගත වැඩමුළු මාලාවක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මානව සම්පත් අංශයේ ද සම්බන්ධීකරණයෙන් පවත්වා ඇති අතර, තවත් වැඩමුළු 03ක් පැවැත්වීමට නියමිතය.
- "ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් තාවකාලිකව අනුයුක්ත කිරීම සම්බන්ධව නිසි මාර්ගෝපදේශයක අවශ්‍යතාව දීර්ඝ කාලයක් පුරා පැවති අතර ඊට පිළියම් ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව ද සහිතව 2022.09.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:21/2022 නිකුත් කිරීම.
- ආර්ථික අර්බුදයට ගැලපෙන පරිදි කාර්යාලීය කටයුතු වඩාත් ඵලදායි අයුරින් ඉටුකිරීමට තොරතුරු තාක්ෂණික දැනුම භාවිතා කරමින් නව ක්‍රමවේද ඔස්සේ කටයුතු සිදුකිරීම.
- පුද්ගලික ගොඩනැගිල්ලක දීර්ඝ කාලයක් පවත්වාගෙන යනු ලැබූ මෙම අංශය, නාරාහේන්පිට "නිල මැදුරේ" 18 වන මහලෙහි ස්ථාපිත කිරීම හා එමඟින් රාජ්‍ය වියදමෙන් වාර්ෂිකව මිලියන 16ක පමණ මුදලක් ඉතිරි කිරීම.
- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන සමූහ රක්ෂණය මඟින් 2021.08.20 සිට 2022.08.19 දක්වා වන රක්ෂණ වර්ෂය තුළ රක්ෂණ ප්‍රතිලාභ 96ක් සහ වසර 3 කට වරක් ක්ෂය පදනම මත ලබා දෙන කාර්යාලීය උපකරණ 2022 වර්ෂය තුළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 14 ක් වෙනුවෙන් ලබා දී ඇත.

# 16. 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන්

- ඒකාබද්ධ හා දීපව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන්ගේ සියලුම ආයතනික කටයුතු සිදු කිරීම
- රාජ්‍ය සේවය පවත්වාගෙන යාම සඳහා දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවා සඳහා අත්‍යවශ්‍ය බඳවා ගැනීම සිදු කිරීම
- ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සිදුකළ යුතු පුහුණුවීම්, දැනුවත් කිරීම් හා භාෂා විගණන සිදු කිරීම
- සේවාරම්භක පුහුණු, ධාරිතා සංවර්ධන පුහුණු හා රාජ්‍ය නිලධාරීන්ගේ සෙසු පුහුණු කටයුතු සිදු කිරීම
- අමාත්‍යාංශය යටතේ පවතින රජයේ නිල නිවාස සඳහා නව නිවාස ප්‍රතිපත්තියක් හඳුන්වා දීම
- අමාත්‍යාංශය යටතේ පාලනය වන නිවාඩු නිකේතන හා සංචාරක බංගලා වෙන් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදයක් හඳුන්වා දීම
- දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදල් පනත් කෙටුම්පත හඳුන්වාදීම
- රාජ සේවා නියුක්ති පනත් කෙටුම්පත සකස් කිරීම
- විශ්‍රාමිකයන්ගේ ගැටලු නිරාකරණය සඳහා දායකත්වය සැපයීම හා විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධ කටයුතු සිදු කිරීම
- රාජ්‍ය සේවය යථාවත්ව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ලබා දීම

# ස්වදේශ කටයුතු අංශය

# உள்நாட்டலுவல்கள் பிரிவு

# Home Affairs Division

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| **1.** | **සමස්ත මූල්‍ය ප්‍රගතිය 2022** | **01 - 08** |
| | 1.1. සමස්ත මූල්‍ය ප්‍රගති සාරාංශය | 01 - 02 |
| | 1.2. විස්තරාත්මක මූල්‍ය ප්‍රගතිය | 02 - 08 |
| **2.** | **2022.01.01 සිට 2022.09.30 දක්වා ස්වදේශ කටයුතු අංශයේ භෞතික ප්‍රගතිය** | **09 - 11** |
| **3.** | **2022.01.01 සිට 2022.09.30 දක්වා ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය** | **12 - 12** |
| **4.** | **අයවැය යෝජනා 2023 - අපේක්ෂිත අයවැය ඇස්තමේන්තුව** | **13 - 13** |

## ස්වදේශ කටයුතු අංශය

ප්‍රධාන අභ්‍යන්තර අංශ නවයකින් සමන්විත මෙම රාජ්‍ය අමාත්‍යාංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 336 ක හා ග්‍රාම නිලධාරී වසම් 14,022 ක සමස්ත කාර්යභාරය මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ වඩා කාර්යක්ෂම හා ඵලදායී මහජන සේවා සැපයීම උදෙසා අවශ්‍ය මානව හා භෞතික සම්පත් මෙන්ම අනෙකුත් පහසුකම් සැපයීම ද සිදුකරනු ලබයි.




## 1. සමස්ත මූල්‍ය ප්‍රගතිය 2022

### 1.1. සමස්ත මූල්‍ය ප්‍රගති සාරාංශය

| # | වැඩසටහන | මුළු වෙන්කිරීම (රු.මි.) | ප්‍රාග්ධන වියදම් (රු.මි.) (A) | පුනරාවර්තන වියදම් (රු.මි.) (B) | මුළු වියදම (රු.මි.) (A+B) | මුළු ආදායම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 1 | ස්වදේශ කටයුතු අංශය | 13,099.00 | 550.39 | 8,501.16 | 9,051.55 | - |
| 2 | දිස්ත්‍රික් මට්ටම (දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල) | 36,939.00 | 6,137.81 | 14,005.82 | 20,143.63 | 113.27 |
| | එකතුව | **50,038.00** | **6,688.20** | **22,506.98** | **29,195.18** | **113.27** |

❖ ප්‍රාග්ධන වෙන්කිරීම

| # | වැඩසටහන | ව්‍යාපෘති අංකය | මුළු වෙන්කිරීම (රු.මි.) (A) | ප්‍රග්ධන වියදම් (රු.මි.) (B) | ඉතිරි අරමුදල් (රු.මි.) (A-B) | වියදම් වල ප්‍රගතිය ( % ) ලෙස (B/A*100) |
|---|---|---|---|---|---|---|
| 1 | අමාත්‍ය කාර්යාලය | 409-01-01 | 0.25 | - | 0.25 | 0 |
| 2 | ස්වදේශ කටයුතු | 409-01-05 | 68.75 | 43.15 | 25.60 | 63 |
| 3 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලනය | 409-01-06 | 17.00 | 5.13 | 11.87 | 30 |
| 4 | ස්වදේශ කටයුතු- සංවර්ධන වැඩසටහන් | 409-02-08 | 1,490.00 | 502.10 | 987.90 | 34 |
| 5 | දිස්ත්‍රික්ක මට්ටම ( දිස්ත්‍රික්ක 25 සඳහා ) | 255-279 | 11,478.00 | 6,137.81 | 5,340.19 | 53 |
| | **මුළු එකතුව** | | **13,054.00** | **6,688.19** | **6,365.81** | **51** |

❖ පුනරාවර්තන වෙන්කිරීම

| # | වැඩසටහන | ව්‍යාපෘති අංකය | මුළු වෙන්කිරීම (රු.මි.) (A) | පුනරාවර්ථන වියදම් (රු.මි.) (B) | ඉතිරි අරමුදල් (රු.මි.) (A-B) | වියදම් වල ප්‍රගතිය % ලෙස B/A*100 |
|---|---|---|---|---|---|---|
| 1 | අමාත්‍ය කාර්යාලය | 409-01-01 | 9.00 | 8.20 | 0.80 | 91 |
| 2 | ස්වදේශ කටයුතු | 409-01-05 | 582.10 | 402.56 | 179.54 | 69 |
| 3 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලනය | 409-01-06 | 10,931.90 | 8,090.40 | 2,841.50 | 74 |
| 4 | දිස්ත්‍රික්ක මට්ටම ( දිස්ත්‍රික්ක 25 සඳහා ) | 255-279 | 25,461.00 | 14,005.82 | 11,455.18 | 55 |
| | **මුළු එකතුව** | | **36,984.00** | **22,506.99** | **14,477.02** | **61** |

## 1.2. විස්තරාත්මක මූල්‍ය ප්‍රගතිය

### 1.2.1. අමාත්‍යාංශ මට්ටම

❖ **ප්‍රාග්ධන වෙන්කිරීම - ස්වදේශ කටයුතු අංශය (409- 01-05,06/02-08)**

| # | වැය විෂය අංකය හා විස්තරය | මුළු වෙන්කිරීම (රු.මි.) (A) | ප්‍රග්ධන වියදම් (රු.මි.) (B) | ශේෂය (රු.මි.) (A-B) |
|---|---|---|---|---|
| 01 | **(409-01-01)**<br>**මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම**<br>2001-ගොඩනැගිලි සහ ඉදිකිරීම්<br>2002- යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ<br>2003-වාහන | 0.05<br>0.05<br>0.05 | -<br>-<br>- | 0.05<br>0.05<br>0.05 |
| 02 | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම**<br>2102-ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ<br>2103- යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 0.05<br>0.05 | -<br>- | 0.05<br>0.05 |

| # | වැය විෂය අංකය හා විස්තරය | මුළු වෙන්කිරීම (රු.මි.) (A) | ප්‍රග්ධන වියදම් (රු.මි.) (B) | ශේෂය (රු.මි.) (A-B) |
|---|---|---|---|---|
| 01 | **(409-01-05)** **මුලධන වත්කම් පුනරුථාපනය හා වැඩිදියුණු කිරීම** 2001-ගොඩනැගිලි සහ ඉදිකිරීම් 2002- යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ 2003-වාහන | 31.40 1.00 2.50 | 17.13 0.02 0.96 | 14.27 0.98 1.54 |
| 02 | **මුලධන වත්කම් අත්පත් කර ගැනීම** 2102-ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ 2103- යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5.00 5.00 | 2.06 0.71 | 2.94 4.29 |
| 03 | **හැකියා වර්ධනය** 2401-කාර්ය මණ්ඩල පුහුණු | 3.85 | 2.28 | 1.57 |
| 04 | **ගොඩනැගිලි ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම** 2104- ගොඩනැගිලි ඉදිකිරීම | 20.00 | 19.99 | 0.01 |

| # | වැය විෂය අංකය හා විස්තරය | මුළු වෙන්කිරීම (රු.මි.) (A) | ප්‍රග්ධන වියදම් (රු.මි.) (B) | ශේෂය (රු.මි.) (A-B) |
|---|---|---|---|---|
| 01 | **(409-01-06)** **මුලධන වත්කම් පුනරුථාපනය හා වැඩිදියුණු කිරීම** 2001-ගොඩනැගිලි සහ ඉදිකිරීම් 2002- යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ 2003-වාහන | 2.00 2.00 3.00 | 0.47 0.07 0.51 | 1.53 1.93 2.49 |
| 02 | **මුලධන වත්කම් අත්පත් කර ගැනීම** 2102-ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ 2103- යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 4.00 1.00 | 0.93 - | 3.07 1.00 |
| 03 | **හැකියාව වර්ධනය** 2401-**කාර්ය මණ්ඩල පුහුණු** | 1.00 | 0.40 | 0.60 |
| 04 | **මාණ්ඩලික ශ්‍රේණියේ ප්‍රාදේශීය නිලධාරීන්ගේ ධාරිතාව වර්ධනය කිරීම 001** 2401-කාර්ය මණ්ඩල පුහුණු | 4.00 | 2.76 | 1.24 |

| # | වැය විෂය අංකය හා විස්තරය | මුළු වෙන්කිරීම (රු.මි.) (A) | ප්‍රග්ධන වියදම් (රු.මි.) (B) | ශේෂය (රු.මි.) (A-B) |
|---|---|---|---|---|
| 06 | තැපැල් හා සන්නිවේදන ගාස්තු (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 4,003,000.00 | 3,439,570.00 | 85% |
| 07 | බාහිර සේවා ලබාගැනීම්<br>- සනීපාරක්ෂක සේවා ⟶<br>- ආරක්ෂක සේවා ⟶ | පොදු වැය ශීර්ෂයක් මගින් ගෙවීම් කටයුතු සිදු කරනු ලබයි. | 3,790,181.92<br>3,231,828.91 | පොදු වැය ශීර්ෂයක් මගින් ගෙවීම් කටයුතු සිදු කරනු ලබයි. |
| 08 | කාර්යය මණ්ඩලයේ වැටුප් වර්ධක ගෙවීම්, උසස් කිරීම්/ විශ්‍රාම ගැන්වීම් කටයුතු | - | - | 95% |
| 09 | කාර්ය මණ්ඩලවලට අදාළ රාජකාරී | -<br>-<br>ස්ථානමාරුවීම් ලැබී ගිය නිලධාරීන් සංඛ්‍යාව = 33<br>ස්ථාන මාරුවීම් ලැබී පැමිණි සංඛ්‍යාව = 43 | | |
| 10 | අමාත්‍ය කාර්ය මණ්ඩල පත්කිරීම් හා අදාළ කටයුතු | - | - | 100% |
| 11 | නිලධාරීන්ගේ පෞද්ගලික සුභසාධනය හා දුක්ගැනවිලි කළමනාකරණය සම්බන්ධ කටයුතු | පවතින සීමාවන් තුළ හැකි උපරිම අන්දමින් ඉටුකර ඇත. | | |
| 12 | පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම | | | 100% |
| | | පාර්ලිමේන්තු ප්‍රශ්න 14ක් සඳහා පිළිතුරු පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත යොමුකර ඇත. | | |
| 13 | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ කටයුතු | අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් 07 ක් අමාත්‍ය මණ්ඩල ලේකම් වෙත යොමු කර ඇත. | | |

### 3. 2023 වසරේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට පවත්නා සීමාවන් තුළ සහ නව තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ මානව සම්පත් හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා සඵලදායීව මෙහෙයවීමට කටයුතු කිරීම 2023 වසරේදී අපේක්ෂා කෙරේ.

## 07. මූල්‍ය අංශය

1. **අරමුණු**

පළාත් සභා සහ පළාත් පාලන අංශයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් සපයාදීම සහ දේශීය සහ විදේශීය අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව යොදාගනිමින් මහජන මුදල් පිළිබඳව විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීම.

2. **2022 වර්ෂයේ තෙවැනි කාර්තුව අවසානය දක්වා කාර්යය**

**මූල්‍ය -2022- තෙවන කාර්තුව** රු.

| වැඩසටහන | 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුව | 2022 වර්ෂයේ තෙවන කාර්තුව දක්වා මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **608,000,000** | **319,600,054** |
| පුද්ගල පඩිනඩි | 174,500,000 | 120,674,749 |
| වෙනත් පුනරාවර්තන වියදම් | | |
| මෙහෙයුම් | 133,500,000 | 85,561,529 |
| සංවර්ධන | 300,000,000 | 113,363,777 |
| **ප්‍රාග්ධන වියදම්** | **14,500,000,000** | **7,914,130,078** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | **7,500,000** | **4,700,445** |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | **21,000,000** | **15,507,647** |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | **95,500,000** | **45,317,547** |
| දේශීය සංවර්ධන ව්‍යාපෘති | **420,000,000** | **212,875,749** |
| විදේශීය ආධාර ලබන සංවර්ධන ව්‍යාපෘති | **13,956,000,000** | **7,635,728,690** |
| **මුළු එකතුව** | **15,108,000,000** | **8,233,730,132** |

**පළාත් සභා සඳහා දායකත්වය** රු.

| වැඩසටහන | 2022 වර්ෂය සඳහා සංශෝධිත ඇස්තමේන්තුව | 2022 වර්ෂයේ තෙවන කාර්තුව දක්වා මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **288,000,000,000** | **223,015,421,000** |
| පුද්ගල පඩිනඩි | 288,000,000,000 | 223,015,421,000 |
| **ප්‍රාග්ධන වියදම්** | **8,000,000,000** | **3,549,650,000** |
| විදේශීය ආධාර ලබන සංවර්ධන ව්‍යාපෘති | 8,000,000,000.00 | 3,549,650,000.00 |
| **මුළු එකතුව** | **296,000,000,000** | **226,565,071,000** |

3. **2023 වසරේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්**

* වඩාත් කාර්යක්ෂමව සඵලදායී විනිවිදභාවයකින් යුතු ගුණාත්මක ගිණුම්කරණ ක්‍රියාවලියක් ඉදිරියටත් පවත්වා ගැනීම
* සෑම අංශයක්ම තම සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී , අත් කරගන්නා මූල්‍ය ප්‍රගතිය එළඹෙන මස තුළ විද්‍යුත් තැපැල ඔස්සේ දැනුම් දීම.
* පවතින අභියෝග තුළ ලිපිද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
* මෙම අංශයේ සේවයේ නියුතු ම නිලධාරීන්ගේ වැන්දඹු අනත්දරු දායක මුදල් වෙනුවෙන් අයකරගැනීම් ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම.

## 08. වියදම් විමංසන අංශය

### 1. අරමුණ

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය හා විමංසනය කිරීම

### 2. 2021 වර්ෂයේ තෙවැනි කාර්තුව අවසානය දක්වා කාර්යසාධනය

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| I. පළාත් සභා මූල්‍ය කාර්යය සාධන වාර්තා සකස් කිරීම. | 2022 වර්ෂය තුළදී ද මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව එම ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් සිදු කරමින් පවතී. ඒ අනුව 2022 අප්‍රේල් මාසය දක්වා පළාත් සභා මූල්‍ය කාර්යසාධන වාර්තා සකස් කර අවසන් කර ඇත. |
| II. පළාත් පාලන ආයතනවල දත්ත පදනම් යාවත්කාලීන කිරීම | • පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන දත්ත පදනම 2022 වර්ෂය සඳහා යාවත්කාලීන කර ඇත<br>• පළාත් පාලන ආයතනයන්හි වාර්ෂික අදායම් හා වියදම් තොරතුරු ඇතුළත් දත්ත පදනම 2022 වර්ෂයට අදාළව යාවත්කාලීන කරන ලදී. එම තොරතුරු විශ්ලේෂණය කර පළාත් පාලන ආයතනවල මූල්‍ය සම්බන්ධ වාර්තාවක් පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත යවන ලදී. පළාත් පාලන ආයතනවල පොදු පහසුකම් තොරතුරු රැස්කර එම තොරතුරු අදාළ වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. |
| III. පළාත් පාලන ආයතනවල ආදායම් හා වියදම් දත්ත පදනම යාවත්කාලීන කිරීම | පළාත් පාලන ආයතනයන්හි වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පදනම 2022 වර්ෂයට අදාලව වාර්ෂිකව යාවත්කාලීන කරන ලද අතර, එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්යය සාධනය සම්බන්ධ වාර්තාවක් සකස් කර සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත යවා ඇත. පළාත් පාලන ආයතන වන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වල පොදු පහසුකම් පිළිබඳ තොරතුරු රැස්කර එම තොරතුරු අදාළ වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. |
| IV. පළාත් සභා මූල්‍ය කාර්යසාධන වාර්තාව සැකසීම | මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතීන්හි මූල්‍ය හා සම්බන්ධ තොරතුරු මාසිකව ලබා ගෙන එම තොරතුරු පළාත් සභා මූල්‍ය කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. |
| V. පළාත් සභාවල මූල්‍ය කටයුතු විමසංනය කිරීමට අදාළ කටයුතු | පළාත් සභා මූල්‍ය කටයුතු විමංසනය කිරීම සඳහා විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, බැංකු සැසඳුම් පිළියෙළ කිරීම, අත්තිකාරම් ගිණුම් සැසඳීම, අග්‍රිම ගිණුම් සැසඳීම වැනි කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් සකසා යවනු ලැබූ ආකෘති පත්‍ර මඟින් 2022 වර්ෂයේ පළමු කාර්තුව දක්වා කාර්තු වාර්තා සකස් කර ඇත. |
| VI. පළාත් පාලන ආයතන වෙත නව ගිණුම් ක්‍රමයක් හඳුන්වාදීමේ කටයුතු | ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ උතුරු නැගනහිර පළාත් පාලන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP) හරහා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව පළාත් පාලන ආයතන වෙත හඳුන්වා දුන් නව ගිණුම් ක්‍රමය බස්නාහිර හා උතුරු මැද පළාත්වල ක්‍රියාත්මක කිරීමට අදාළ නියෝග හා රීති ගැසට් කර ඇති අතර නව ගිණුම් ක්‍රමය යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත. එමෙන්ම සෙසු පළාත්වල අදාළ නියෝග හා රීති සම්බන්ධ ගැටළු පිහිටුවා ඇති කමිටුවක් මගින් විසඳීමට කටයුතු කරයි. |

### 3. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත සැලසුම්

1. පළාත් සභා මූල්‍ය කාර්යය සාධන වාර්තා සකස් කිරීමට අදාළ කටයුතු අඛණ්ඩව සිදු කිරීම
2. සේවක සංඛ්‍යා දත්ත පදනම 2023 වර්ෂයට අදාළව යාවත්කාලීන කිරීම
3. පළාත් පාලන ආයතනවල ආදායම්, වියදම් සහ පොදු පහසුකම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පදනම 2023 වර්ෂයට යාවත්කාලීන කිරීම
4. 2023 වර්ෂයේ පළාත් සභා මූල්‍ය කාර්ය සාධන වාර්තාව සකස් කිරීම
5. පළාත් සභාවන්හි මූල්‍ය කටයුතු විමසංනය කිරීමට අදාළ කටයුතු අඛණ්ඩව සිදු කිරීම
6. පළාත් පාලන ආයතන වෙත නව ගිණුම් ක්‍රමයක් හඳුන්වාදීමේ කටයුතු ඉතිරි පළාත් සඳහා ක්‍රියාත්මක කිරීම

## 09. අභ්‍යන්තර විගණන අංශය

### 01. අරමුණ

අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමේදී භෞතික හා මානව සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා වන සාර්ථක අභ්‍යන්තර පාලන ක්‍රම පවතින්නේද යන්න ඇගයීම හා එම පාලන ක්‍රමයන්වල අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා වන මාර්ගෝපදේශ සැපයීම.

### 02. 2022 වර්ෂයේ තෙවැනි කාර්තුව අවසානය දක්වා

- මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
- සංශෝධිත විගණන සැලැස්ම ඉදිරිපත් කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2022.09.30 දක්වා මාසික ප්‍රගතිය වාර්තා කිරීම.
- කළමනාකරණ විගණන කමිටු රැස්වීම් 03 ක් පැවැත්වීම.
- ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් 07 ක් පැවැත්වීම.
- අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලබන විශේෂ විමර්ශන 04 ක් සිදු කිරීම.

**වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ප්‍රගතිය**

| අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් | ප්‍රගතිය % |
|---|---|
| 1. සේවා ගිවිසුම හා නඩත්තු කටයුතු | 100 |
| 2. මුදල් කළමනාකරණය | 100 |
| 3. පළාත් පාලන ආයතන වෙත අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබාදීම | 100 |
| 4. පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැඟුම) | 100 |
| 5. ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය | 100 |
| 6. ගෙවීම් වවුචර් කළමනාකරණය | 100 |
| 7. තැන්පත් ගිණුම් ක්‍රියාකරකම් | 100 |
| 8. පළාත් පාලන ආයතනවල අවශ්‍යතා විශ්ලේෂණයට භාජනය කර ප්‍රමුඛතාව අනුව ව්‍යාපෘති හඳුනාගැනීම, ක්‍රියාත්මක කිරීම | 100 |
| 9. සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය | 100 |
| 10. පුද්ගල ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 100 |
| 11. පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 100 |
| 12. මාසික හා වාර්ෂික ගිණුම් වාර්තා ක්‍රියාකාරකම් | 100 |
| 13. වත්කම් කළමනාකරණ | 100 |
| 14. පළාත් පාලන ආයතනවල කාර්යය පහසු හා සුමට කිරීම සඳහා නව විද්‍යුත් මෙවලම් හඳුන්වාදීම | 90 |
| 15. ක්‍රියාකාරී සැලැස්ම අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචන ක්‍රියාවලිය | 100 |
| 16. ව්‍යාපෘති කළමනාකරණ, ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු හා පසුවිපරම් | 100 |
| 17. ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතිය | 100 |
| වෙනත්: | |
| 18. කණ්ඩලම සංචාරක බංගලාව පිළිබඳ අභ්‍යන්තර විගණනය | 100 |
| 19. ව්‍යාපෘති කාර්යමණ්ඩල කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණනය<br>- ප්‍රවාහන සම්බන්ධතා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය, ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය,පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැඟුම), සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය, ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය (අදියර I,II,III) | 100 |
| 20. ව්‍යාපෘති ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණනය<br>පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැඟුම) සහ ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය | 100<br>100 |

### 03. 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

1. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු
   - මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
   - ඇස්තමේන්තුගත වෙන් කිරීම් හා විගණන අවදානම් ක්ෂේත්‍ර සැලකිල්ලට ගෙන වාර්ෂික විගණන සැලැස්ම පිළියෙල කිරීම හා ඒ අනුව වාර්ෂික විගණන කටයුතු සිදු කිරීම.
   - වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම හා ඒ අනුව මාසික ප්‍රගතිය වාර්තා කිරීම.
   - කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම.
   - ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්වීම.

- අමාත්‍යාංශයේ සහ විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය යටතේ පවත්නා විදේශාධාර ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
- දේශීය ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.

2. රාජ්‍ය ගිණුම් කාරක සභාව කැඳවීම් කරන අවස්ථාවලදී ඒ සඳහා සහභාගීවීම.
3. අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලැබෙන විශේෂ විමර්ශන සිදු කිරීම.

## 10. ක්‍රමසම්පාදන අංශය

### 1. අරමුණ

අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගැනීමට අදාළ සැලසුම්, මාර්ගෝපදේශ හා ක්‍රමෝපායන් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම මෙන්ම සමාජ ආර්ථික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ප්‍රතිපත්ති/ උපායමාර්ග/ සැලසුම්/ වැඩසටහන්/ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම හා ඊට අදාළ සෙසු කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ සෙසු අංශවලට අවශ්‍ය සහයෝගය ලබා දීම.

### 2. 2022 වර්ෂයේ තෙවැනි කාර්තුව අවසානය දක්වා කාර්යසාධනය

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| 1. **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම** | අමාත්‍යාංශයේ 2021 වසරට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර එය අවශ්‍ය පරිදි යාවත්කාලීන කර ඇත. |
| **2.** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය වාර්තා කිරීම | • අමාත්‍යාංශයේ ප්‍රගතිය ඇතුළත් වාර්තා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මාසිකව හා කාර්තුමය වශයෙන් ලබා දී ඇත.<br>• ක්‍රියාකාරී සැලැස්මට අනුව ඒ ඒ අංශ හා ආයතනවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය මාසිකව ලබා ගැනීම හා එම වාර්තා අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත. |
| **3.** ධරණීය සංවර්ධන අභිමතාර්ථ සම්බන්ධ කටයුතු | ධරණීය සංවර්ධන අභිමතාර්ථ හා සංවර්ධන තොරතුරු හා වාර්තා ධරණීය සංවර්ධන අභිමතාර්ථ සභාවට ලබා දී ඇත. |
| **4.** නාගරික දත්ත පද්ධතිය සම්බන්ධීකරණය | ලංකාවේ නගරවල වර්තමාන තත්ත්වය පිළිබඳ දත්ත පද්ධතියට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත. |

### 3. 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

1. පළාත් පාලන හා පළාත් සභා බල ප්‍රදේශවල ග්‍රාමීය හා දුෂ්කර ගම්වලට මුල් තැන දෙමින් ප්‍රාථමික පාසල්, මාතෘ නිවාස, වැඩිහිටි හා ළමා නිවාස සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමේ විශේෂ ව්‍යාපෘති අදාළ ආයතන සමග සැලසුම් කර ක්‍රියාත්මක කිරීම හා ඊට අවශ්‍ය සහාය ලබාදීම.

2. පළාත් සභා හා පළාත් පාලන කෘෂි මාර්ග, ග්‍රාමීය මාර්ග හා පළාත් මාර්ග ලක්ෂයේ වැඩසටහන හා ජාතික මට්ටමේ මාර්ග පද්ධතියට සම්බන්ධ කෙරෙන අයුරින් සංවර්ධනය කිරීම සඳහා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරීන් සමග සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කිරීම හා ඊට අවශ්‍ය සහාය ලබාදීම.

## 11. ව්‍යාපෘති අධීක්ෂණ අංශය

### 1.අරමුණ

විවිධ ජාත්‍යන්තර මූල්‍ය ආයතන මඟින් ලබාදෙන ණය හා ප්‍රදාන යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති මනා අධීක්ෂණයකින් යුක්තවත් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකිවන ලෙසත් මෙහෙයවීම.

### 2. 2022 වර්ෂයේ තෙවැනි කාර්තුව අවසානය දක්වා කාර්යසාධනය

I. 2022 වර්ෂයේ සඳහා වෙන් වූ රු.මිලියන 23,192.00 ක ප්‍රතිපාදනවලින් තෙවන කාර්තුව අවසන් වන විට රු.මිලියන 1,1251.63 ක් උපයෝජනය කර ඇත.

II. JICA තාක්ෂණික ආධාර මත ක්‍රියාත්මක මට්ටමේ පවතින උතුරු පළාතේ දියර කිරි සංවර්ධන ව්‍යාපෘතියට අදාළ විවිධ ලේඛන/වාර්තා සැකසීම සම්බන්ධීකරණය සිදු කර ඇත.

III. කොරියාවේ සෙමාවුල් පදනමේ තාක්ෂණික ප්‍රදාන යටතේ ජීවනෝපාය හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට අදාළ අවබෝධතා ගිවිසුමෙහි කෙටුම්පත සඳහා අදාළ පාර්ශ්වයන්ගේ එකඟතාව ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

IV. කොළඹ මහානගර සභාවේ බදු වර්ග 04 ක් සඳහා ඩිජිටල් පද්ධතියක් ස්ථාපිත කිරීමට KOICA ආයතනයේ තාක්ෂණික ප්‍රදාන යටතේ මූල්‍යාධාර ලබාගැනීම සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වකරුවන්ගේ (ICTA/CMC)

ඒකඟතාව මත සකස් කළ සංකල්ප පත්‍රිකාව හා ව්‍යාපෘති වාර්තාව අවශ්‍ය නිර්දේශ සමඟ මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

V. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ v වන අදියර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකරමින් පවතී.

VI. මුදල් අමාත්‍යාංශයේ උපදෙස් මත 2020 වර්ෂයේ අත්හිටුවන ලද ද්විතියික නගර තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යෝජිත ප්‍රාරම්භක පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා 2022.03.15 දින මෙම අමාත්‍යාංශය හා නාගරික සංවර්ධන හා නිවාස පිළිබඳ අමාත්‍යාංශය ඒකාබද්ධව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතීන් ලබා ගෙන ඇති අතර දැනට ඊට අදාළ ව්‍යාපෘති යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

VII. ශ්‍රී ලංකාවේ ගිනි ආරක්ෂණ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා පළාත් පාලන ආයතනවලින් ලබා ගත් තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය යාවත්කාලීන කරමින් පවතී.

VIII. මහනුවර නගරය ආශ්‍රිතව ඉදිකිරීමට යෝජිත කේබල් කාර් ව්‍යාපෘතිය සඳහා TOR සකස් කර ඇත.

IX. ඔස්ට්‍රියාවෙන් ආනයනය කළ ගිනි නිවන රථ 15 ක් කොළඹ මහා නගර සභාවට හා කෝට්ටේ මහා නගර සභාවට බෙදා දීම හා කොළඹ මහා නගර සභාව විසින් පරිහරණය කළ ගිනි නිවන රථ 13 ක් එම පහසුකම් නොමැති පළාත් පාලන 13ක් වෙත බෙදා දී ඇත.

X. පළාත් සභාවලින් ඉදිරිපත් වූ විවිධ ව්‍යාපෘති යෝජනා 09 ක් පරීක්ෂා කර අවශ්‍ය අරමුදල් ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඊට අමතරව වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීම ඉලක්ක කර අපනයන ප්‍රවර්ධන හා ආනයන ආදේශන ව්‍යාපෘති පළාත් මට්ටමෙන් හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

XI. විදේශාධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය, විශ්ලේෂණය හා ගැටලු විසඳීම ඉලක්ක කර ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 8 ක් පවත්වා එමගින් ව්‍යාපෘතිවල ගැටලු නිරාකරණය සඳහා මැදිහත්වීම සිදු කර ඇත.

XII. 2022 වර්ෂයේ විදේශාධාර ව්‍යාපෘතිවල සේවයට බඳවා ගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණ 7 ක් පවත්වා ඇත. පුරප්පාඩු තනතුරු 35 ක් සඳහා නව බඳවා ගැනීම් සිදුකර ඇත. සේවා කාලය සම්පූර්ණ වී ඇති තනතුරු 152 ක් සඳහා සේවා දිගු ලබාදීම හා තනතුරු 14 ක සේවය අත්හිටුවීම ද සිදු කර ඇත.

XIII. විදේශාධාර ව්‍යාපෘති කළමණාකරණ ඒකක හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකවල නිලධාරින්ගේ පරිපාලනමය කාර්යයන් පහසු තිරීම සඳහා දත්ත පද්ධතියක් සකස් කර ඇත.

XIV. විදේශාධාර ව්‍යාපෘති කාර්ය මණ්ඩලවල සේවය කරන විවිධ කාර්ය මණ්ඩල හා ඔවුන්ගේ යැපෙන්නන් 152කට වීසා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කර ඇත.

XV. මෙහෙයුම් රැස්වීම් 15 ක් සඳහා දූත මණ්ඩල අනුමැතිය (Mission Clearance) ලබා දීමට කටයුතු කර ඇත.

XVI. "ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය, මහා කොළඹ අපජල කළමණාකරණ ව්‍යාපෘතිය හා ද්විතික නගර තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යෝජිත ප්‍රාරම්භක පහසුකම් සැපයීම" යන ව්‍යාපෘති සඳහා කැබිනට් පත්‍රිකා 4 ක් සකස් කර ඇති අතර ඉන් කැබිනට් පත්‍රිකා 3 ක් සඳහා අනුමැතිය ලබාගෙන ඇත.

### 3. 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

1 මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියලුම විදේශාධාර ව්‍යාපෘති, ව්‍යාපෘති අරමුණු කරා සම්බන්ධීකරණය කිරීම

2 නව ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම සඳහා අවශ්‍යතා විශ්ලේෂණය කිරීම (Need Analysis) හා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම

3 ජාතික මෙහෙයුම් කමිටු (NSC) රැස්වීම් 06ක් පැවැත්වීම හා ඒ තුළින් පැන නගින ගැටලු නිරාකරණය කිරීම

4 ව්‍යාපෘති ප්‍රගතිය පසුවිපරම් කිරීම හා මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම

**ව්‍යාපෘති අධීක්ෂණ අංශය යටතේ විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

| 11.1. පුරනැඟුම (අතිරේක ප්‍රතිපාදන) / පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | 12,300 (USD 67.84 Mn) |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන්(රු.මි.) | ආසියානු සංවර්ධන බැංකුව - 10,700 – (USD 60 Mn) |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 6 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2017 / 2023 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | බස්නාහිර, වයඹ, දකුණු, ඌව, මධ්‍යම, උතුරු මැද, සබරගමුව පළාත් |

### 5. ව්‍යාපෘතියේ අරමුණු

නිදන්ගත වකුගඩු රෝග ඇතිවීම අඩු කිරීම හා ප්‍රාදේශීය පාලනයේදී වඩා හොඳ සේවාවන් ලබාදීම

### 6. මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2021.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2022 ප්‍රතිපාදන | 2022.09.30)ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| **12,300** | **8,904.39** | **72%** | **2,250.00** | **1,186.62** | **53%** | **10,091.01** | **82%** |

### 7. 2022.09.30 දිනට භෞතික ප්‍රගතිය

| 2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2022.01.01 සිට 2022.09.30 දක්වා) (B) | 2022.09.30 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 81% | 6% | 87% |

### 8. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

- 2022-2023 වර්ෂවල උතුරු මැද, වයඹ, මධ්‍යම සහ ඌව පළාත්වල පවුල් 83,420කට ආරක්ෂිත පානීය ජල පහසුකම් ලබා දීමේ ඉලක්ක සපුරාලීමට අදාළ ඉතිරි වැඩ නිම කිරීම.
- එම ප්‍රදේශවල මේ දක්වා නිම කළ ව්‍යාපෘතිවලින් පවුල් 16,580 කට නව ජල සම්බන්ධතා පහසුකම් සැලසෙන අතර ඉතිරි ව්‍යාපෘති නිම කිරීමෙන් 2023 වර්ෂයේදී පවුල් 23,420 කට නව පානීය ජල සැපයුම් පහසුකම් ලබා දීම හා දැනට ජලය ලබා ගන්නා පවුල් 60,000 කට පිරිසිදු හා අඛණ්ඩ ජල සැපයුම ලබාදීම ද අපේක්ෂා කෙරේ.
- 2023 ආරම්භය වන විට දැනට ඉදිකෙරෙමින් පවතින සමාජ යටිතල පහසුකම් ව්‍යාපෘති සියල්ලෙහි වැඩ නිම කිරීමෙන් ප්‍රාදේශීය සභා 29 ක ධාරිතාවය ඉහළ නැංවීම
- 2023 වර්ෂය සඳහා ඉල්ලා ඇති මුළු මුදල රු. මිලියන 2,035 ඉහත අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීම.

| 11.2. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි ) | රු.මි 14,534 (**අදියර V**) |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | නෙදර්ලන්තය රු.මි 14,534 (**අදියර V**) |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | අවුරුදු 3 (**අදියර V**)<br>**ජූලි 2021 සිට ජූලි 2024** |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | **දිවයින පුරා** |

### 5. ව්‍යාපෘතියේ අරමුණු

1. ජාතික ආර්ථික වර්ධනය අරමුණු කර ගනිමින් ග්‍රාමීය ජනතාවගේ ගමනාගමන පහසුව සහ ජීවන තත්වයේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම
2. ග්‍රාමීය ජනතාවගේ පොදු සුරක්ෂිත බව වර්ධනය කිරීම
3. ග්‍රාමීය ප්‍රදේශවල මෙතෙක් භාවිතයට නොගත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම
4. පහසු ප්‍රවේශ සැපයීම තුළින් හුදෙකලා ප්‍රදේශවල සංවර්ධනය ඉහළ නැංවීම

### 6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2021.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2022 ප්‍රතිපාදන | 2022.09.30)ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 14,534 (අදියර V) | 2,546.30 | 17.5% | 300 | 207.26 | 69% | 2,753.56 | 18.9% |

### 7. 2022.12.31 දිනට භෞතික ප්‍රගතිය

| 2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2022.01.01 සිට 2022.09.30 දක්වා) (B) | 2022.09.30 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| තනි මංතීරු පාලම් 19 ක් සහ ද්විත්ව මංතීරු පාලම් 1 ක මූලික සැලසුම්කරණ කටයුතු සිදුකර ඇත. | තනි මංතීරු පාලම් 23 ක් සහ ද්විත්ව මංතීරු පාලම් 1 ක මූලික සැලසුම්කරණ කටයුතු සිදුකර ඇත. | තනි මංතීරු පාලම් 42 ක් සහ ද්විත්ව මංතීරු පාලම් 2 ක මූලික සැලසුම්කරණ කටයුතු සිදුකර ඇත. |

8. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

දැනට ව්‍යාපෘතියේ පැන නැගී ඇති ගැටළු නිරාකරණය කර පාලම් තට්ටු මෙරටට ගොඩබෑමෙන් අනතුරුව, පාලම් 50 ක් පමණ භෞතික ඉදිකිරීම් නිම කිරීමට බලාපොරොත්තුවේ.

| 11.3. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ( GCWMP) | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි ) | 14,331 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | ආසියානු සංවර්ධන බැංකුව (ADB) – රු.මි. 12268 |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | අවුරුදු - 12<br>අප්‍රේල් 2010 - දෙසැම්බර් 2022 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | • බස්නාහිර පළාත/කොළඹ දිස්ත්‍රික්කය/කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය |

5. ව්‍යාපෘතියේ අරමුණු

මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, කොළඹ මහ නගර සභාවේ ආයතනික සහ මෙහෙයුම් ධාරිතාව ශක්තිමත් කිරීම සහ කොළඹ මහනගර සභාවේ ව්‍යාපෘති කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව වැඩිදියුණු වේ.

6. මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2021.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2022 ප්‍රතිපාදන | 2022.09.30)ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 14331 | 14277 | 99.6 | 1200 | 592 | 49.3 | 14869 | 100 |

*ඇස්තමේන්තුගත මුළු පිරිවැය නිර්ණය කිරීමේදී ණය ගිවිසුමට එළඹි දිනයේ පැවති විනිමය අනුපාතිකය සලකන ලදී.

7. 2022.12.31 දිනට භෞතික ප්‍රගතිය

| 2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2022.01.01 සිට 2022.09.30 දක්වා) (B) | 2022.09.30 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 91.2% | 3.6% | 94.8% |

8. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

- කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ තෝරාගත් කිලෝමීටර් 10ක මලාපවාහන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ කිලෝමීටර් 125ක මලාපවහන මාර්ගවල තත්ත්වය තක්සේරු කිරීම සහ W1 මළාපවාහන මාර්ග විමර්ශන කටයුතු.
- අපජල පොම්පාගාරය සැලසුම් කිරීම, ඉදිකිරීම, ස්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.
  - වනාතමුල්ල පොම්පාගාරය 2023 පළමු කාර්තුව තුළ අවසන් කිරීම.
  - මාලිගාවත්ත, තිඹිරිගස්යාය, බොරැල්ල සහ Vystwyke පොම්පාගාර ඉදිකිරීම.
  - වනාතමුල්ල සහ Vystwyke පොම්පාගාර ආශ්‍රිතව පීඩන නළ මාර්ග ඉදිකිරීම

| 11.4. මහ කොළඹ ජල සහ අපද්‍රව්‍ය ජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන – (GCWWIIMP - කොටස 2 සහ 3) | | |
|---|---|---|
| 1 | **සමස්ත ආයෝජනය (රු.මි )** | 28180 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | ආසියානු සංවර්ධන බැංකුව (ADB) - 14,225<br>යුරෝපීය ආයෝජන බැංකුව (EIB) - 8750 |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | 6 Years<br>සැප්තැම්බර් 2016 - ඔක්තෝබර් 2022 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | • බස්නාහිර පළාත/කොළඹ දිස්ත්‍රික්කය/කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය |

5. ව්‍යාපෘතියේ අරමුණු

කොළඹ නගරයේ දකුණු ජල පෝෂක ප්‍රදේශයේ අපජල පද්ධතිය පුනරුත්ථාපනය කිරීම, එම ප්‍රදේශයේ ඉදිකරන ලද ද්විතියික අපජල පවිත්‍රාගාරය වැඩිදියුණු කිරීම සහ සේවා සපයන්නාගේ ආයතනික ව්‍යුහය සහ ධාරිතාව ශක්තිමත් කිරීම.

**6.මූල්‍ය ප්‍රගතිය**

**(රු.මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2021.12.31 සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2022 ප්‍රතිපාදන | 2022.09.30)ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| **GCWWMIIP (Tranche 02)** 1227 | 491.7 | 40 | 800 | 276.11 | 34.5 | 767.81 | 62.6 |
| **GCWWMIIP (Tranche 03)** 26953 | 5148.7 | 19.1 | ADB-1400 EIB-650 | 428.33 | 30.6 | 5577 | 20.7 |

7. **2022.12.31 දිනට භෞතික ප්‍රගතිය**

| 2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2022.01.01 සිට 2022.09.30 දක්වා) (B) | 2022.09.30 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 1. GCWWMIIP (Tranche 02) – 29.52%<br>2. GCWWMIIP (Tranche 03) – 18.09% | 1. GCWWMIIP (Tranche 02) – 22.4%<br>2. GCWWMIIP (Tranche 03) – 0.86% | 1. GCWWMIIP (Tranche 02) – 51.96%<br>2. GCWWMIIP (Tranche 03) – 18.95% |

**8. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්**

1. මලාපවහන 97.2km (89 km (ගුරුත්වාකර්ෂණ මලාපවහන) + 8.2 km (බල ප්‍රධාන)) තත්ත්වය තක්සේරු කිරීම
2. කිරුළපන ජල පෝෂක ප්‍රදේශය සඳහා නව ගුරුත්වාකර්ෂණ කාණු, බල ප්‍රධාන මාර්ග සහ පොම්පාගාර සැපයීම
3. වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය (WWTP) 4. කිරුළ-නාරාහේන්පිට ප්‍රදේශයට මලාපවහන පහසුකම් ලබාදීම - කොන්ත්‍රාත්තුව 2023 පළමු කාර්තුවේදී ප්‍රදානය කිරීමට නියමිතය.
5. දෝෂ සහිත මලාපවහන අලුත්වැඩියා කිරීම සහ දක්ෂිණ ජල පෝෂක ප්‍රදේශයේ අඩු ධාරිතාවයෙන් යුත් මලාපවහන ඉහළ නැංවීම සහ ක්‍රියාත්මක කිරීම - කොන්ත්‍රාත්තුව 2023 පළමු කාර්තුවේදී ප්‍රදානය කිරීමට නියමිතය.

| 11.5. නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) | | |
|---|---|---|
| 1 | **සමස්ත ආයෝජනය (රු.මි )** | දේශීය = රු.මි. 3,474<br>විදේශීය = රු.මි. 12,957 × 2.5<br>= රු.මි. 32,392.5<br>එකතුව = රු.මි. 35,866.5 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | 12,957 JPY |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | 07<br>2017-2024 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | උතුරු, නැගෙනහිර,<br>උතුරු මැද සහ ඌව පළාත් |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

ප්‍රධාන වශයෙන් වී අස්වනු වැඩිකිරීම සඳහා දැනට අක්‍රිය තත්වයේ ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග සංවර්ධනය කිරීම, වී අස්වනු හා වෙනත් කෘෂි නිෂ්පාදන ප්‍රවාහනයට අවශ්‍ය ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම හා පිරිසිදු පානීය ජල අවශ්‍යතා සපුරාලීම සහ වකුගඩු ආශ්‍රිත රෝග නිවාරණය කිරීම සඳහා ඉහළ ගුණාත්මකභාවයෙන් යුක්ත පානීය ජලය ලබා දීම මගින් ප්‍රදේශවල ප්‍රජාවගේ මූලික ජීවන තත්වය වර්ධනය කිරීම.

**6.මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)** (JPY 12,957 × 2.5 LKR = 32,392.5 LKR)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2021.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2022 ප්‍රතිපාදන | 2022.09.30)ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 32,392.5 (FA)<br>3,474.00 (GOSL) | 4,237.22 | 12% | 2,210.00 | 1,299.03 | 59% | 5,536.25 | 15% |

## 7. 2022.12.31 දිනට භෞතික ප්‍රගතිය

| 2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2022.01.01 සිට 2022.09.30 දක්වා) (B) | 2022.09.30 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 39.80% | 69.80% | 47.21% |

## 8. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

අදියර II හා අදියර III යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වාරි මාර්ග, මාර්ග හා ජල යෝජනා අනුව සම්පූර්න කර ව්‍යාපෘතිය අවසන් කිරීම.

| 11.6. ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය<br>- පළාත් මාර්ග සංවර්ධන සංරචකය | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි ) | 15,400/- |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | ලෝක බැංකුව<br>15,200/-<br>ශ්‍රී ලංකා රජය<br>200/- |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>3.2 ආරම්භක වසර / අවසාන වසර | අවුරුදු 4<br>ආරම්භය - 2019<br>අවසානය - 2023 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | පළාත් නවයම (09) ආවරණය වන පරිදි |

## 5. ව්‍යාපෘතියේ අරමුණු

පළාත් 09 හි මාර්ග කි.මී. 397 කාපට් අතුරා සංවර්ධන කිරීම, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිවල / දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල හැකියාව වර්ධනය සහ පළාත් කාර්යය මණ්ඩලවලට ප්‍රයෝජන ගත හැකි වන පරිදි බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අනුබද්ධව නිර්මාණ හා සැලසුම් පුහුණු ආයතනයක් (Design Centre) ගොඩනැඟීම.

## 6. මූල්‍ය ප්‍රගතිය

(රු.මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2021.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2022 ප්‍රතිපාදන | 2022.09.30ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| FA<br>15200 | 5343 | 35% | 2950.50 | 2800 | 95% | 8143 | 54% |
| DF<br>200 | 73.7 | 37% | 50 | 30.2 | 60% | 103.9 | 52% |

## 7. 2022.12.31 දිනට භෞතික ප්‍රගතිය

| 2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2022.01.01 සිට 2022.09.30 දක්වා) (B) | 2022.09.30 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 55% | 9% | 64% |

## 8. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

මාර්ග කි.මී 397 හි ඉතිරි වැඩ ප්‍රමාණය කාපට් අතුරා කාණු පද්ධතිය සකස්කර මාර්ග සංඥා සවිකර අවසන් කිරීම.

| 11.7. ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ - පළාත් සංරචකය (PSSP) | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (පළාත් සංරචකය) | **රු.මි** 21,188.44<br>ඇ.ඩො.මි 134 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුළු ඇස්තමේන්තු පිරිවැය | ලෝක බැංකුව<br>**රු.මි** 31.624.53<br>ඇ.ඩො.මි 200<br>(ඇ.ඩො.මි 09 ක මුදලක් CERC අරමුදල සඳහා ලබා ගන්නා ලදී) |
| 3 | **3.1** ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>**3.2** ආරම්භක වසර / අවසාන වසර | 05<br>2018-2023 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක හා පළාත් |

## 5. ව්‍යාපෘතියේ අරමුණු

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකබව වර්ධනය කරමින් බෝ නොවන රෝග අවදානම ඇති පුරවැසියන් හඳුනාගෙන එම රෝග පාලනය කිරීම හා කළමණාකරණය කිරීම.

## 6. මූල්‍ය ප්‍රගතිය

(රු.මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2021.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2022 ප්‍රතිපාදන | 2022.09.30)ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 20,450 *1 | 6,212 | 30% *2 | 5,000 | 2,035 | 41% | 8,247 | 40% |

## 7. 2022.12.31 දිනට භෞතික ප්‍රගතිය

| 2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2022.01.01 සිට 2022.09.30 දක්වා) (B) | 2022.09.30 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 44% | 11% | 55% |

*1. 2019 සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 11,450 ක ප්‍රතිපාදන ලැබී ඇති අතර දළ වශයෙන් 2023 වර්ෂය සඳහා රු. මිලියන 9,000 ක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කර ඇත. ඒ අනුව සමස්ත ආයෝජනය රු. මිලියන 20,450 කි.

*2. 2019 සිට 2021 වර්ෂය දක්වා ව්‍යාපෘතියට ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය (ආයෝජනය කළ මුදල) රු. මිලියන 6,450.15 ක් වන අතර වියදම් කරන ලද මුදල රු. මිලියන 6,212 කි. ඒ අනුව 2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය 96% කි.

## 8. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

| ක්‍රියාකාරකම | උප ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| 1. නව ඉදිකිරීම් හා අලුත් වැඩියා කිරීම | |
| I. රසායනාගාර | 17 |
| II. සායන මධ්‍යස්ථාන | 40 |
| III. දන්ත ශල්‍යාගාර | 17 |
| IV. ඖෂධ ගබඩා | 19 |
| V. ETU | 27 |
| VI. සෞඛ්‍ය නිල නිවාස | 55 |
| VII. වෙනත් | 253 |
| 2. දැනුවත් කිරීමේ වැඩසටහන් | 159 |
| 3. IT පහසුකම් හා සංවර්ධන | 70 |
| 4. වෛද්‍යමය උපකරණ මිලදී ගැනීම | 136 |
| 5. වෛද්‍ය නොවන උපකරණ මිලදී ගැනීම | 121 |
| 6. සෞඛ්‍ය කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන | 196 |
| 7. උපයෝගිතා වාහන මිලදී ගැනීම | 23 |

5. **ව්‍යාපෘති අරමුණ**

පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම හා එම ප්‍රදේශවල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් වගකීමෙන් හා වගවීමෙන් යුතු පළාත් පාලන සේවාවක් මහජනයාට සැපයීම.

| 11.8. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) | | |
|---|---|---|
| 1 | ආරම්භක මුළු ආයෝජනය (රු.මිලියන)<br>සංශෝධිත මුළු ආයෝජනය (රු.මිලියන) | **18,016**<br>**15,009** |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු. මි ) | ලෝක බැංකුව – 10,600<br>යුරෝපා සංගමය – 4,233<br>ශ්‍රී ලංකා රජය – 1253 |
| 3 | 3.1 ව්‍යපෘති කාලය (අවුරුදු) | අවුරුදු 3.5 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2019 – 2022 (සැලසුම් කරන ලද කාලසීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකිවීම හේතුවෙන් මාස 21 ක කාල දිගුවක් ඉල්ලා ඇත) |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | උතුරු, නැගෙනහිර, උතුරු මැද හා ඌව පළාත් |

6. **2022.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2021.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2022 ප්‍රතිපාදන | 2022.09.30)ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 15,009 | **1060.96** | **7.3%** | 3350.00 | 1375.27 | 41% | **2436.23** | **16.23%** |

7. **2022.09.30 දිනට භෞතික ප්‍රගතිය**

| 2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2022.01.01 සිට 2022.09.30 දක්වා) (B) | 2022.09.30 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 32% | 17% | 49% |

I. BT අදියර යටතේ උප ව්‍යාපෘති 379ක් හදුනා ගෙන ඇති අතර ඉන් 190ක කටයුතු නිම කොට ඇත. උප ව්‍යාපෘති 07ක් 50% -90% ත් අතර ප්‍රගතියක් පෙන්නුම් කරන අතර සෙසු උප ව්‍යාපෘති 182 , 0% ත් 5%ත් අතර ප්‍රගතියක් ක්‍රියාත්මක වෙමින් පවතී.

II. PT 1 අදියර යටතේ උප ව්‍යාපෘති 658 ක් හදුනා ගෙන ඇති අතර ඉන් 450 ක කටයුතු නිම කොට ඇත.උප ව්‍යාපෘති 69 ක් 50% -90% ත් අතර ප්‍රගතියක් පෙන්නුම් කරන අතර සෙසු උප ව්‍යාපෘති 182 , 0% ත් 5%ත් අතර ප්‍රගතියක් ක්‍රියාත්මක වෙමින් පවතී.

III. ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන උප ව්‍යාපෘති 26ක් අනුමත කර ඇති අතර ඒවායේ ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

IV. COVID නිවාරණ උප ව්‍යාපෘති 913 ක් අනුමත කර වැඩ අවසන් කර ඇත.

**8. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්**

1. රටේ පවතින ආර්ථික අර්බුදයට පිළියම් යෙදිය හැකි වන උප ව්‍යාපෘති හදුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම
2. BT 2 හා BT3අදියරෙහි උප ව්‍යාපෘති 2023 අගෝස්තු මස වන විට කිරීම
3. BT 4 හා BT 5 අදියරෙහි උප ව්‍යාපෘති 2024 ජුලි මස වන විට නිම කිරීම
4. PT 2 අදියරෙහි උප ව්‍යාපෘති 2024 ජුලි මස වන විට නිම කිරීම
5. PT 3අදියරෙහි උප ව්‍යාපෘති 2024 අගෝස්තු මස වන විට නිම කිරීම
6. ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන අදියරෙහි උප ව්‍යාපෘති 2024 ජුලි මස වන විට නිම කිරීම

| 11.9. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය | | |
|---|---|---|
| 1. | සමස්ත ආයෝජනය (රු.මි ) | ඇමරිකානු ඩොලර් මිලියන 100 |
| 2. | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | ලෝක බැංකුව විසින් අරමුදල් සපයයි |
| 3. | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>3.2 ආරම්භක වසර / අවසාන වසර | 05<br>2018/2019 - 2024 |
| 4. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | සියලුම පළාත් |

## 5. ව්‍යාපෘතියේ අරමුණු

ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම

## 6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | 2021.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2022 වර්ෂය සඳහා වෙන් කිරීම | (2022.01.01-2022.09.30) තෙවන කාර්තුව දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 5428* | 2413.10 | 44% | 3010 | 1540.07 | 51% | 3953.17 | 73% |

* 2020, 2021, 2022 අයවැය ප්‍රතිපාදන (මෙය අයවැය සහාය ව්‍යාපෘතියක් නිසා)

## 7. 2022.12.31 දිනට භෞතික ප්‍රගතිය

මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමේ ආකාරව, 2021 වර්ෂය සඳහා පහත සඳහන් ව්‍යාපෘතියේ බෙදාහැරීම් හා සම්බන්ධිත දර්ශක (Disbursement Link Indicators – DLIs)/ කාර්යසාධනය පදනම් කරගත් කොන්දේසි (Performance Based Conditions – PBCs) සාක්ෂාත් කරන ලදී.

- DLI 1: ඉලක්කගත පාසල් 250 ක සිසුන්ගෙන් 40% කගේ ඉංග්‍රීසි භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම, ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් වැඩිදියුණු කිරීමේ (ELLE) වැඩසටහන යටතේ පාසල් 500ක සිසුන්ට ප්‍රතිලාභ සැලසීම.
- DLI 2: ඉලක්කගත පාසල් 250ක සිසුන්ගෙන් 40ක% ගේ ගණිත භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම, පාසල් 500 ක සිසුන් සඳහා ගණිත ඉගෙනුම් වැඩිදියුණු කිරීමේ (MLE) වැඩසටහන යටතේ ප්‍රතිලාභ සැලසීම.
- DLI 5: වෘත්තියමය වශයෙන් සුදුසුකම් ලත් නව ගුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම - අතිරේක වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් 12,000 ක් (කාන්තාවන් 50%)
- DLI 9: COVID-19 වසංගතය වැළැක්වීම සහ සනීපාරක්ෂක පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම ඇතුළු පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩ සටහන සෑම අධ්‍යාපන කලාපයකටම හඳුන්වා දී ඇත.

## 8. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම

# 12. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG)

## 1. හැඳින්වීම

1999 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කර ඇති පළාත් පාලනය පිළිබද ශ්‍රී ලංකා ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිල බලයෙන් පත්වන සාමාජිකයන් 8 දෙනෙකු සහ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකු ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ඇති අතර ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂකවරයා විසින් සිදුකරනු ලැබේ.

**2022 වර්ෂයේ තෙවැනි කාර්තුව අවසානය දක්වා කාර්යසාධනය**

| අංශය | අපේක්ෂිත වැඩමුළු | පවත්වන ලද වැඩමුළු | පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|
| | 29 | 24 | 925 |
| පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන | 31 | 29 | 1422 |
| භෞතික සැලසුම් සහ පරිසර | 36 | 36 | 1395 |
| පුහුණු | 8 | 7 | 258 |
| පරිගණක | 31 | 17 | 487 |
| මූල්‍ය කළමණාකරණ අංශය | 36 | 29 | 1225 |
| නීති අංශය | 18 | 8 | 198 |
| මාධ්‍ය අංශය | 5 | 3 | 45 |
| **එකතුව** | **194** | **153** | **5955** |

## 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

- යහපාලන පළාත් සභා හා පළාත් පාලන ක්‍රමයක් උදෙසා එම ක්ෂේත්‍රවල මහජන නියෝජිතවරුන් හා නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය.

- පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල සංවිධාන ව්‍යුහයන් හා කළමණාකරණ හැකියාවන් වැඩිදියුණු කිරීමට සහාය වීම සහ පළාත් සභා හා පළාත් පාලන කේෂ්ත්‍රයේ උපදේශක පැවරුම් බාරගැනීම.
- පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම හා තොරතුරු බෙදා හැරීම.
- ඩිප්ලෝමා පාඨමාලා 05 ක්, සහතික පත්‍ර පාඨමාලා 12 ක් හා කෙටිකාලීන පුහුණු වැඩසටහන් 216 ක් පැවැත්වීම
- පළාත් පාලන පුවත්පත (කාර්තුමය) සිංහල / දෙමළ හා පළාත් පාලන සගරාව (වාර්ෂික) සම්පාදනය කිරීම

## 13. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)

### 1. හැඳින්වීම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල 1916 අංක 22 දරණ ආඥා පනත යටතේ ආරම්භ කර ඇති අතර වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදල, පළාත් පාලන ආයතනවල දිගුකාලීන ආදායම් උත්පාදන හා සංවර්ධන ව්‍යාපෘතිවලට මූල්‍ය සවිය ලබාදෙන ප්‍රධානතම රාජ්‍ය ආයතනය වේ.

- **අරමුදලේ ප්‍රධාන කාර්යභාරය**

  දැනට ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර ඇති මහා නගර සභා 23 (කොළඹ මහා නගර සභාව හැර), නගර සභා 41 සහ ප්‍රාදේශීය සභා 276 ද ඇතුළුව පළාත් පාලන ආයතන 340 සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී අනුපාතයක් යටතේ සැපයීම අරමුදලේ මූලික කාර්යභාරය වේ.

### 2. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ප්‍රගතිය -2022 තෙවන කාර්තුව දක්වා

| කාර්යය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි) 2022.09.30 | 2022.09.30 දිනට සත්‍ය අගය (රු.මි) | ප්‍රගතිය |
|---|---|---|---|
| **ණය මුදල් නිකුත් කිරීම** | 675 | 567 | 84% |
| **ණය අය කිරීම** | 730 | 632 | 87% |
| **භාණ්ඩාගාරයට ගෙවීම** | 270 | 115 | 43% |

**2022 තෙවන කාර්තුව දක්වා කාර්යසාධනය -ණය අනුමත කිරීම සහ නිකුත් කිරීම්.**

**ණය අනුමත කිරීම**

| අ.අ | පළාත් පාලන ආයතනය | | ව්‍යාපෘතිය | වටිනාකම (රු) |
|---|---|---|---|---|
| 01 | මහරගම | න.ස | සෝලා පද්ධතියක් සවිකිරීම | 8,800,000.00 |
| 02 | කොටිකාවත්ත මුල්ලේරියාව | ම.න.ස | ආදහනාගාරය ඉදි කිරීම | 43,000,000.00 |
| | **එකතුව** | | | **51,800,000.00** |

| | **ණය නිකුත් කිරීම - 2022** | | | |
|---|---|---|---|---|
| අ.අ. | පළාත් පාලන ආයතනය | | ව්‍යාපෘතිය | වටිනාකම |
| 1 | පස්බාගේ කෝරලය | ප්‍රා.ස. | සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම | 1,990,000.00 |
| 2 | ගලේවෙල | ප්‍රා.ස | සෝලා පද්ධතියක් සවිකිරීම | 4,800,000.00 |
| 3 | කැකිරාව | ප්‍රා.ස. | කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම | 9,445,000.00 |
| 4 | පොලොන්නරුව | ම.න.ස | බහු කාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම | 15,500,000.00 |
| 5 | කුරුණෑගල | ම.න.ස. | මධ්‍යම වෙළෙඳපොළ ඉදි කිරීම | 269,858,000.00 |
| 6 | කුලියාපිටිය | න.ස. | පොදු වෙළෙඳ සංකීර්ණය ඉදි කිරීම | 152,770,000.00 |
| 7 | රත්නපුර | ම.න.ස | මැණික් මධ්‍යස්ථානයක් ඉදි කිරීම | 83,844,000.00 |
| 8 | කෑගල්ල | ප්‍රා.ස. | පොදු වෙළෙඳ සංකීර්ණය ඉදි කිරීම | 3,231,000.00 |
| 9 | අයගම | ප්‍රා.ස. | වෙළෙඳ සංකීර්ණය ඉදි කිරීම | 4,960,000.00 |
| 10 | බෙන්තොට | ප්‍රා.ස. | පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 7,229,897.00 |
| 11 | කොටිකාවත්ත මුල්ලේරියාව | ප්‍රා.ස. | ආදහනාගාරය ඉදි කිරීම | 5,600,000.00 |
| 12 | පානදුර | ප්‍රා.ස. | වෙළෙඳ සංකීර්ණය ඉදි කිරීම | 4,231,000.00 |
| 13 | මහරගම | න.ස | සෝලා පද්ධතියක් සවිකිරීම | 4,000,000.00 |
| | | | **එකතුව** | **567,458,897.00** |

### 3. 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

01. පළාත් පාලන ආයතවල ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා වන ණය ඉල්ලුම සම්පූර්ණ කිරීම.

02. ආයතනික හැකියාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම.

03. පළාත් පාලන ආයතන සඳහා තරගකාරී මූල්‍ය දායකත්වයක් ලබා දීම.